ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ හා ආපදා කළමනාකරණ
අමාත්‍යාංශය

නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය



# සමාජයීය කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුව

මූල්‍ය සහයෝගීතාව

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

ඔක්තෝබර් 2018

# පටුන


කෙටි යෙදුම් ලැයිස්තුව ........ 03

වගු සටහන් ........ 04

විධායක සාරාංශය ........ 05

1. සමාජ කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුවේ විෂය පථය ........ 07

2. පසුබිම ........ 09

3. ව්‍යාපෘති විස්තරය ........ 10

 3.1 ව්‍යාපෘතියේ ඉලක්ක සහ අරමුණු ........ 10

 3.2 බලපෑම් සහිත ප්‍රදේශ සහ ජනතාව පිළිබඳ විස්තරය ........ 10

4. සමාජ කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුවේ අරමුණු ..... 12

5. ව්‍යාපෘතිය තුළින් සිදු විය හැකි අහිතකර සමාජයීය බලපෑම ........ 14

6. සමාජයීය බලපෑම අවම කිරීම සඳහා මූලධර්ම සහ මාර්ගෝපදේශයන් ........ 15

7. නාය යෑම් හේතුවෙන් ආපදාවට ලක්වූ පුද්ගලයන් සඳහා වන්දි ගෙවීම ........ 19

8. නෛතික රාමුව ........ 24

 අ) 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත ........ 24

 ආ) 1950 අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සහ 2008 ඉඩම් අත්පත් කර ගැනීමේ රෙගුලාසි ........ 24

 ඉ) ජාතික ස්වේඡා නොවන නැවති පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව ........ 25

 ඊ) 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි නීතිය ........ 26

 උ) මහ නගර සභා ආඥා පනත සහ නගර සභා ආඥා පනත ........ 26

9. උපදේශනය සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ........ 28

 9.1 පාර්ශවකරුවන් විශ්ලේෂණය ........ 28

 9.2 පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා සහභාගිත්වය ........ 28

10. පිළියම් යෙදූ ස්ථාන කළමනාකරණය ........ 31

11. ගැටුම් නිරාකරණය හා දුක්ගැනවිලි පිළිබඳ ක්‍රියාපටිපාටිය ........ 35

12. අධීක්ෂණය සහ ඇගයීම ........ 35

13. ශක්‍යතා වර්ධනය සහ පුහුණුව ........ 37

## ඇමුණුම් ලැයිස්තුව

**ඇමුණුම 01.** නාය යෑම් හේතුවෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කිරීම් ක්‍රියාත්මක කිරීමේ රාමුව ........ 38

**ඇමුණුම 02.** ඉඩම් හිමියන් සමග ඇතිකර ගැනීමට යෝජිත ගිවිසුම ........ 38

**ඇමුණුම 03.** දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමේ අයදුම් පත්‍රය ........ 38

**ඇමුණුම 04.** ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් සහ අත්දැකීම් ........ 38

# කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව |
| APs | බලපෑමට ලක් වූ පුද්ගලයින් |
| ACLG | පළාත් පාලන සහකාර කොමසාරිස් |
| CBO | ප්‍රජා පාදක සංවිධාන |
| DGRC | දිස්ත්‍රික් දුක් ගැනවිලි සහන කමිටුව |
| DM | ආපදා කළමනාකරණය |
| DMC | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| GoSL | ශ්‍රී ලංකා ආණ්ඩුව |
| GN | ග්‍රාම නිලධාරී |
| GRC | දුක්ගැනවිලි සහන කමිටුව |
| LAA | ඉඩම් අත්පත් කර ගැනීමේ පනත |
| LAR | ඉඩම් අත්පත් කර ගැනීමේ රෙගුලාසි |
| LGRC | ප්‍රාදේශීය දුක් ගැනවිලි සහන කමිටුව |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය |
| NIRP | ජාතික ස්වේඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය |
| NPPD | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව |
| PD | ව්‍යපෘති අධ්‍යක්‍ෂක |
| PPAs | ව්‍යපෘති සහයෝගිතා නියෝජිතායතන |
| PIB | මහජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකාව |
| PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| RDO | ග්‍රාමීය සංවර්ධන නිලධාරී |
| SMRPF | සමාජයීය කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුව |
| SMP | සමාජයීය කළමනාකරණ සැලසුම් |
| SDO | සමාජ සංවර්ධන නිලධාරී |
| SIA | සමාජයීය බලපෑම් තක්සේරුකරණය |
| SLR | ශ්‍රී ලංකා දුම්රිය සේවය |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය |

# වගු ලේඛනය


වගුව 01: දිස්ත්‍රික්ක අනුව නැවත පදිංචි කිරීමට නියමිත නිවාස ඒකක ............................................ 08

වගුව 02: දිස්ත්‍රික්ක අනුව ඉදි කර ඇති නිවාස ඒකක .......................................................................... 08

වගුව 03: යෝජිත නාය යෑම් අවමකරණ ව්‍යාපෘතියේ සෘජු ප්‍රතිලාභ ................................................ 09

වගුව 04: 2000 - 2010 කාලය තුළ සිදු වූ නාය යෑම්වල බලපෑම ...................................................... 11

වගුව 05: සිදුවිය හැකි හානි සහ බලපෑම් වර්ගීකරණය ........................................................................ 14

වගුව 06: සමාජයීය බලපෑම් අවමකිරීම සඳහා යෝජිත මූලධර්ම සහ මාර්ගෝපදේශයන් ............. 15

වගුව 07: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන්නන් සඳහා වන්දි ගෙවීමට අදාළ හිමිකම් ........ 19

වගුව 08: ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ සහභාගිත්ව ක්‍රියාකාරකම් සහ පාර්ශවකරුවන් දැනුවත් කිරීම ....................................................................................................................................... 29

වගුව 09: සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් ඇගයීම සහ අධීක්ෂණය සඳහා දර්ශක සහ විචල්‍යයන් .. 36

## විධායක සාරාංශය

**ව්‍යාපෘති විස්තරය:** මෙම ව්‍යාපෘතිය තුළින් නාය යෑමේ අවදානමට ලක්ව ඇති දුම්රිය මාර්ග, අධිවේගී මාර්ග, මහා මාර්ග, ජල සම්පාදන හා විදුලි බල සහ සන්නිවේදන ජාල වැනි ප්‍රධාන යටිතල පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා නාය යෑම් අවම කිරීමේ පියවරයන් ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය තුළ සිදු කිරීමට හඳුනා ගෙන ඇති නාය යෑම් අවමකරණ පියවරයන් ප්‍රධාන වශයෙන් කාණ්ඩ තුනකට වර්ග කරනු ලබයි. පළමු කාණ්ඩය යටතේ නාය යෑම් අවදානම් සහිත ස්ථානයන්ගේ ජල මට්ටම අවම කිරීම සඳහා කාණු පද්ධති සංවර්ධනය කිරීම, දෙවන කාණ්ඩය යටතේ බෑවුමේ ස්ථාවරත්වය වර්ධනය කිරීම සඳහා බෑවුම් වැඩිදියුණු කිරීම සහ තෙවන කාණ්ඩය යටතේ දිගු කාලීන බෑවුම් ස්ථායීකරණය සඳහා නාය යෑම් පාලන පියවර ගැනීම සිදු කරනු ඇත.

**සමාජයීය වශයෙන් සිදු විය හැකි බලපෑම:** මෙම ව්‍යාපෘතියට අදාළ හඳුනාගත් ස්ථානයන්හි නාය යෑම් අවදානම අවම කිරීමේ ක්‍රියාකාරකම් හේතුවෙන් තාවකාලිකව වෙනත් ස්ථානයන්හි පදිංචි කිරීම්, වගා කටයුතුවලට හානි මෙන්ම ගොඩනැගිලි, ඉඩම්, වෙනත් ව්‍යුහයන්, ආදායම් මාර්ග සහ එලදායී යටිතල පහසුකම් සඳහා ප්‍රධාන සමාජයීය බලපෑම් සිදු වීමට ඉඩ ඇත.

**සමාජයීය කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ රාමුව:** මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවිය හැකි සමාජ බලපෑම හඳුනා ගැනීම, සමාජයීය ආරක්ෂණ පියවරයන් සම්පාදනය මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ආයතනික වශයෙන් වන පිළියෙල කිරීම්, එනම් දුක්ගැනවිලි සඳහා සහන සැලසීම, උපදේශනය, සහභාගිත්වය, හෙළිදරව් කිරීම සහ ව්‍යාපෘති අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සඳහා අදාළ වන මූලධර්ම හා ක්‍රමවේදයන් රැසක් ඉදිරිපත් කර ඇත. මීට අමතරව සමාජයීය මැදිහත්වීම හා වගකීම් සහගත භාවය වර්ධනය කිරීමේ අරමුණින් සහභාගිත්ව ප්‍රවේශය ශක්තිමත් කිරීමට අදාළව අතිරේක මූලධර්ම රාශියක් මෙම ප්‍රතිපත්ති රාමුව තුළ අන්තර්ගතව ඇත. සමාජයීය බලපෑම් තක්සේරු කිරීමේදී විශේෂිත සැලැස්මකට යටත්ව සිදු කිරීමට මෙම ප්‍රතිපත්ති රාමුව ඉඩ සලස්වා ඇත. කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ රාමුව තුළ වගකීම් සහගත භාවය සහ සමාජයීය මැදිහත්වීම ශක්තිමත් කිරීම හරහා බහු සහභාගිත්ව ප්‍රවේශයක් නිර්මාණය කිරීමේ අරමුණින් අතිරේක මාර්ගෝපදේශයන් රාශියක් ඇතුළත් කර ඇත. එසේම මෙම ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව ස්ථානීය විශේෂිත ක්‍රියාකාරී සැලැස්මක් යටතේ සමාජයීය බලපෑම් තක්සේරු කිරීම් සිදු කරනු ඇත.

**සමාජයීය බලපෑම් අවම කිරීම සඳහා පියවරයන්:** මෙම ව්‍යාපෘතිය සැලසුම්කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් කළමනාකරණයේදී සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට ප්‍රමාණවත් පරිදි මැදිහත් වීමට අවස්ථාව ලබාදී ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සමාජ බලපෑම් අවම කිරීමේ පියවරයන් සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේ දී තාවකාලික අවශ්‍යතාවන් මත පුද්ගලයින් වෙනත් ස්ථානයන්හි පදිංචි කිරීමට සිදු වුවද මෙහි අවසාන අරමුණ වන්නේ නැවත පදිංචි කිරීමේ අවස්ථාවන් අවම කිරීම වේ. එබැවින් ව්‍යාපෘතියේ මූලික පියවරක් වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී තාවකාලිකව නැවත පදිංචි කිරීමට සිදුවන පවුල් සහ නාය යෑම් අවමකරණ කටයුතු සඳහා යොදා ගැනීමට සිදුවන ඉඩම්වල හිමකරුවන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹිය යුතුය. එසේම, ව්‍යාපෘතියට අදාළ කටයුතු හේතුවෙන් යම් පුද්ගලයෙකු සතු ගොඩනැගිලි, ඉඩම්, වෙනත් නිර්මිතයන්, ආදායම් මාර්ග, එලදායී

යටිතල පහසුකම් හා කෘෂි කාර්මික කටයුතුවලට අලාභ හෝ හානි වන්නේ නම් වර්තමාන වෙළෙඳපොළ වටිනාමක අනුව වන්දි ගෙවීම් සිදු කළ යුතුය.

**දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයඃ** මෙම යන්ත්‍රණය ප්‍රධාන අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වේ. අ). දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ප්‍රාදේශීය කමිටුව (LGRC) - බලපෑමට ලක්වූ පුද්ගලයින් විසින් සිය දුක් ගැනවිලි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ඇති CDO වෙත ඉදිරිපත් කළ යුතුය. CDO විසින් එම දුක් ගැනවිලි ප්‍රාදේශීය දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුවට යොමු කරනු ලබයි. එම කමිටුව විසින් අදාළ ග්‍රාම නිලධාරීවරුන්ගේ සහයෝගය මත සතියක කාල සීමාවක් ඇතුළත දුක් ගැනවිලි සඳහා සහන සැලසීමට කටයුු කරනු ලබයි. ආ). දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ දිස්ත්‍රික් කමිටුව (DGRC) - ප්‍රාදේශීය කමිටු මට්ටමින් විසඳුම් ලබාදීමට නොහැකි යම් දුක් ගැනවිල්ලක් පවතින්නේ නම් එම දුක්ගැනවිලි පිළිබඳ විසඳුම් ලබා දීම සඳහා CDO විසින් ඊට අදාළ සියලුම ලිපි ලේඛන සහිතව දිස්ත්‍රික් කමිටුව වෙත යොමු කළ යුතුය. DGRC විසින් සති දෙකක කාලසීමාවක් තුළ ව්‍යාපෘති සහයෝගීතා නියෝජිතායතනයන්හි සමග ඒකාබද්ධව එම දුක්ගැනවිලි පිළිබඳ තීරණ ලබා දිය යුතුය. ඉ). දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ස්වාධීන මණ්ඩලය (IGP) - දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ දිස්ත්‍රික් කට්ටුව විසින් ලබාදෙන තීරණයක් සම්බන්ධයෙන් බලපෑමට ලක්වූ පුද්ගලයින් සෑහීමකට පත්නොවන අවස්ථාවකදී දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ස්වාධීන කමිටුව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය. IGP විසින් සති දෙකක කාලයක් තුළ අදාළ තොරතුරු විමර්ශනය කිරීමෙන් පසු සිය තීරණය ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ස්වාධීන කමිටුව විසින් ලබා දුන් තීරණය ද බලපෑමට ලක්වූ පාර්ශවය එකඟ නොවන්නේ නම් අධිකරණය වෙත යොමු වීමට අවස්ථාව පවතී.

**අධීක්ෂණ සහ ඇගයීම් යාන්ත්‍රණයඃ** ස්වාධීන ආරක්ෂණ අධීක්ෂණ සහ සමාලෝචන විශේෂඥයින්ගේ සහභාගිත්වයෙන් යුතු අධීක්ෂණ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ. එම අධීක්ෂණ යාන්ත්‍රණය තුළ මාර්ගෝපදේශයන්, කොන්දේසි හා නිර්දේශයන්, අධීක්ෂණ දර්ශකයන්, ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සහ ක්‍රමවේදයන්, ක්‍රියාත්මක කළ යුතු වාර ගණන, ලිපි ලේඛන සහ වාර්තා කිරීමේ විධිවිධානයන් යනාදී සියල්ල ඇතුළත් වේ.

## 01. සමාජ කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුවට අයත් විෂය පථය

මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ යෝජිත නාය යෑම් අවමකරණ වැඩබිම් 147ට අදාළව සමාජ ආරක්ෂණ වැඩසටහන් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක වන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා අධීක්ෂණය සහ ඇගයීම් සිදු කිරීමත් දුක්ගැනවිලි සඳහා සහන සැලසීම, උපදේශනය, සහභාගිත්වය, අනාවරණය කිරීම් ඇතුළත්ව සමාජ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක සඳහා වන ආයතනික විධිවිධානත්, සමාජ ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මත කිරීම සඳහා මග පෙන්වීමත් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බලපෑම් හඳුනා ගැනීමත් සඳහා මූලධර්ම සහ මාර්ගෝපදේශයන් සමුච්ඡයක් සකස් කර ඇත.

ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් හේතුවෙන් යම් පුද්ගලයෙක් සතු ගොඩනැගිලි, ඉඩම්, වෙනත් ව්‍යුහයන්, ආදායම් මාර්ග, ඵලදායී යටිතල පහසුකම් හෝ වගා කටයුතුවලට හානි සිදු වීමක දී ඒ සඳහා හානිපූරණ වන්දි ගෙවීම් මෙම ව්‍යාපෘතිය යටතේම සිදු කරනු ලැබේ. ඒ සඳහා අදාළ වන්දි මුදල ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ වර්තමාන වෙළෙඳපොළ වටිනාකම අනුව තීරණය කරනු ලබයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශවල පදිංචිව සිටින පවුල් සඳහා වන්දි ගෙවීම් හෝ වෙනත් ප්‍රතිලාභයන් ලැබීමට අදාළ සුදුසුකම් ලැබීමේ නිර්ණායකයන් වගු අංක 07 හි දක්වා ඇත.

එහෙත් නාය යෑම් හේතුවෙන් ආපදාවන්ට ලක් වූ හෝ නාය යෑම් අධි අවදානම් කලාපයන් තුළ පදිංචි වීම හේතුවෙන් නැවත පදිංචි කිරීමට නිර්දේශ කර ඇති පවුල් සඳහා නිවාස ආධාර ලබාදීම හෝ මූල්‍ය ආධාර ලබාදීමක් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු නොකරන බව අවධාරණය කළ යුතුය. එසේ නාය යෑම් හේතුවෙන් විපතට පත්වූවන් සහ නාය යෑම් අධි අවදානම් කලාපයන්හි පදිංචි වූවන් නැවත පදිංචි කිරීම සඳහා නිවාස ආධාර ලබා දීමේ වැඩසටහනක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් මේ වන විටත් ක්‍රියාත්මක කරමින් පවතී. එම නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය හරහා නැවත පදිංචි වන්නන්ට අහිතකර බලපෑමක් සිදු නොවන බවට හා එම පවුල්වල ජීවන මට්ටම යථා තත්ත්වයට පත්කිරීම සහ නැවත පදිංචි කරනු ලබන පරිසරයට ඔවුන් අනුගත වන බවට තහවුරු කර ගැනීමේ අරමුණින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. නැවත පදිංචි කිරීම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති රාමුව ඇමුණුම 01හි දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ නැවත නිවාසයක් ඉදි කරන්නේ නම් රුපියල් 1,200,000.00 ක්ද තමාගේ ඉඩමක් වෙනුවෙන් හෝ ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් 400,000.00 ක මුදලක් ද පිරිනමනු ලබයි. මෙම වැඩසටහන තුළ හිමිකරු විසින්ම වෙනත් ස්ථානයක පදිංචි වීම, නිවාස ඉදි කිරීමේ පොදු වැඩසටහන් හෝ ආරක්ෂක අංශ විසින් නිවාස ඉදි කර දීම වැනි කිරීම වැනි විකල්ප අවස්ථාවන් කිහිපයක් හඳුන්වා දී ඇත. ඊට අමතරව සුරක්ෂිත ස්ථානයක පිහිටි නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීම සඳහා රුපියල් 1,600,000ක් දක්වා මුදලක්ද පිරිනමනු ලබයි. මෙම වැඩසටහන යටතේ 2016 වර්ෂයේ දී කෑගල්ල දිස්ත්‍රික්කය තුළ නිවාස 1980ක් ඉදි කර ඇත. නාය යෑම් අධි අවදානම් හේතුවෙන් නැවත පදිංචි කිරීම 14,860ක් හඳුනාගෙන ඇත. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 01: දිස්ත්‍රික්ක අනුව නැවත පදිංචි කිරීමට තීරණය කර ඇති නිවාස

| දිස්ත්‍රික්කය | නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගෙන ඇති නිවාස ඒකක | දිස්ත්‍රික්කය | නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගෙන ඇති නිවාස ඒකක |
|---|---|---|---|
| කළුතර | 929 | කෑගල්ල | 824 |
| බදුල්ල | 6418 | රත්නපුර | 757 |
| නුවර එළිය | 3496 | මාතර | 591 |
| මහනුවර | 1296 | හම්බන්තොට | 343 |
| මාතලේ | 210 | **එකතුව** | **14,860** |

මේ වන විට කළුතර, රත්නපුර, ගාල්ල. මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන් තුළ නිවාස ඉදි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතී.

වගුව 02: දිස්ත්‍රික්ක අනුව ඉදි කර ඇති නිවාස ඒකක

| **දිස්ත්‍රික්කය** | **ඉදි කර ඇති නිවාස ඒකක** | **දිස්ත්‍රික්කය** | **ඉදි කර ඇති නිවාස ඒකක** |
|---|---|---|---|
| කළුතර | 1325 | මාතර | 525 |
| රත්නපුර | 1618 | හම්බන්තොට | 81 |
| ගාල්ල | 338 | **එකතුව** | **3887** |

නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගත් නිවාස සඳහා නාය යෑම් අවමකරණ ව්‍යාපෘතිය මගින් වන්දි ගෙවීම් සිදු කරනු නොලැබේ.

## 2. පසුබිම

ශ්‍රී ලංකා රජය විසින් නාය යෑම් අවම කිරීම සඳහා අදාළ සැලසුම් හා ඉදි කිරීම් අධීක්ෂණය/ කළමනාකරණය සහ පොදු කටයුතු සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 97ක්ද ඇතුළත්ව වසර තුනක (2018 ජනවාරි 01 - 2018 දෙසැම්බර් 31) කාලයක් තුළ ක්‍රියාත්මක කරනු ලබන ආයෝජනයක් සැලසුම් කර ඇත. මෙම ආයෝජන කාර්යය සඳහා මූල්‍ය සහයෝගීතාව ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වෙතින් ලබා ගැනීමට අපේක්ෂිතය. මෙම ආයෝජන කාර්යය හරහා නාය යෑම් අවමකරණ පියවරයන් ක්‍රියාත්මක කර නාය යෑම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීමත් එමගින් දැනට නාය යෑම් අධි අවදානම් තත්ත්වයන් යටතේ ජීවත් වන ජනතාව සහ පවතින ගොඩනැගිලි සඳහා පිළියම් යෙදීමත් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව දිස්ත්‍රික්ක 10ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 60ක් තුළ නාය යෑම් අවදානම් යටතේ ජීවත්වන පුද්ගලයින් 12,000කට ප්‍රතිලාභ සැලසෙනු ඇත. එසේ වුවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විවිධ සමාජයීය බලපෑම් සිදු විය හැකිය. AIIB හි පාරිසරික හා සමාජයීය ප්‍රතිපත්ති රාමුවට (ESF) සහ පාරිසරික හා සමාජයීය ප්‍රමිතීන්ට (ESS) අනුකූලව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සෑම අදියරයකටම අදාළව සමාජයීය බලපෑම සහ අවදානම ඇගයීම, කළමනාකරණය සහ නියාමනය කිරීමේ වගකීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන විසින් දරනු ලබයි. සමාජ කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවෙහි අරමුණ වන්නේ නාය යෑම් අවම කිරීමේ පියවරයන් වඩාත් සුමටව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමත් සැලසුම්කරණය, පිරිසැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම යන අවස්ථාවන්හිදී ප්‍රජා සහභාගිත්වය සහ බලපෑමට ලක්වන ජනතාවගේ සහයෝගීතාව ලබා ගැනීම තුළින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සිදු විය හැකි සමාජයීය බලපෑම අවම කිරීමත් වේ.

වගුව 04: යෝජිත නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ සෘජු ප්‍රතිලාභ

| **දර්ශකය** | **ප්‍රතිලාභීන්** |
|---|---|
| සුරක්ෂිත වන පවුල් | පවුල් 3000 |
| සුරක්ෂිත වන නිවාස ඒකක | නිවාස ඒකක 2700 |
| සුරක්ෂිත වන පොදු පහසුකම් | රෝහල් 02<br>පාසල් 05<br>ආගමික ස්ථාන 2 |
| නාය යෑම් අවදානමෙන් නිදහස් වන ඉඩම් | වර්ග මීටර් 4,499,100 |
| සුරක්ෂිත වන මහා මාර්ග ජාලයේ දිග | කි. මී. 15 |
| සුරක්ෂිත වන දුම්රිය මාර්ග ජාලයේ දිග | කි.මී. 150 |

මූලාශ්‍රය: හඳුනාගත් ස්ථානවලින් (වැඩබිම්වලින්) ලබා ගත ප්‍රාථමික දත්ත

## 3. ව්‍යාපෘති විස්තරය

ශ්‍රී ලංකාව තුළ නාය යෑම්, බෑවුම් අස්ථාවර වීම් සහ ගල් පෙරලීම් වැනි ස්වාභාවික ආපදා තත්ත්වයන් නිරන්තරයෙන් දක්නට ලැබෙන ස්වභාවික සංසිද්ධියක් බව බවට පත්ව ඇත. එම ආපදා තත්ත්වයන් හේතුවෙන් මිනිස් ජීවිතවලට සිදුවන බලපෑම හා සිදුවන ආර්ථික හානිය හේතුවෙන් මේ පිළිබඳ දැඩි අවධානයක් යොමුව ඇත. අතීතයේදී සුරක්ෂිත ස්ථාන වශයෙන් හඳුනාගත් කඳු බෑවුම්වලද මානව ක්‍රියාකාරකම් වර්ධනය වීම හේතුවෙන් වර්තමානයේදී නාය යෑම් සිදු වීම් වාර්තා වීම වැඩි වී ඇත. පවතින වාර්තාවන්ට අනුව ස්වභාවික ආපදාවන් හේතුවෙන් මිනිස් ජීවිත 1000ක් පමණ අහිමි වී ඇති අතර පුද්ගලයින් 300,000කට අධික පිරිසකට සිය නිවාස අහිමි වී ඇත. ඊට අමතරව ආපදා තත්ත්වයන් හේතුවෙන් අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, රෝහල්, පාසල් සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් විශාල ප්‍රමාණයක් හානියට පත්විය. 2017 වර්ෂයේ මැයි මස තුළ සිදු වූ ස්වභාවික ආපදාවන් හේතුවෙන් වාර්තා වූ පුද්ගල මරණ 219 අතරින් පුද්ගල මරණ 176ක් සඳහා හේතු වී ඇත්තේ ප්‍රධාන නාය යෑම් සිදුවීම් 35කි. මෙම තත්ත්වය මත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ පළාත් 6කට අයත් දිස්ත්‍රික්ක 11ක අධි අවදානම් කලාපයන්හි පිහිටි අස්ථාවර කඳු බෑවුම් සඳහා පිළියම් යෙදීමට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සඳහා ඉල්ලීමක් සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය හරහා දුම්රිය මාර්ග, අධිවේගී මාර්ග, මහා මාර්ග, ජලසම්පාදන හා විදුලි බල පද්ධති සහ සන්නිවේදන පද්ධති ඇතුළු ප්‍රධාන යටිතල පහසුකම් සුරක්ෂිත කිරීමට අදාළ පියවරයන් ක්‍රියාත්මක කිරීමට නියමිතය. එතුළින් නාය යෑම් අවදානම් සහිත ප්‍රජාවන් එම ආපදාවන් හේතුවෙන් සිදු විය හැකි හානිවලින් සුරක්ෂිත කර ගැනීමට හැකියාව ලැබේ. ප්‍රධාන වශයෙන් නාය යෑම් අවමකරණ පියවරයන් කොටස් තුනකට වර්ග කළ හැකිය.

**පළමු වර්ගය:** නාය යෑම් සිදුවන ප්‍රදේශයන්ගේ ජලාපවහන කළමනාකරණය කිරීම සඳහා කාණු පද්ධති වැඩි දියුණු කිරීම

**දෙවන වර්ගය:** බෑවුමේ ස්ථායීතාව වැඩි දියුණු කිරීම සඳහා බෑවුම් නවීකරණ කටයුතු

**තෙවන වර්ගය:** දිගු කාලීන බෑවුම් ස්ථායිකරණහ සඳහා නාය යෑම් පාලන පියවරයන්

### 3.1 ව්‍යාපෘතියේ ඉලක්ක සහ අරමුණ

නාය යෑම් අවමකරණ පියවරයන් ක්‍රියාත්මක කර නාය යෑම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීමටත් එමගින් දැනට නාය යෑම් අධි අවදානම් තත්ත්වයන් යටතේ ජීවත් වන ජනතාව සහ පවතින ගොඩනැගිලි සඳහා පිළියම් යෙදීමටත් මෙම ව්‍යාපෘතිය ඉලක්ක ගත කෙරේ. ඒ යටතේ i) තෝරා ගත් නාය යෑම් සහ අස්ථායී බෑවුම් සඳහා පිළියම් යෙදීම ii) නාය යෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ශක්‍යතාව වර්ධනය කිරීම iii) නාය යෑම් අවදානම් කලාපයන්ට යෝග්‍ය ඉඩම් භාවිත පරිචයන් හා ඉදිකිරීම්/ සංවර්ධන කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ හඳුන්වාදීම සහ රෙගුලාසිකරණය iv) නාය යෑම් අවමකරණ ක්‍රියාවලිය පිළිබඳ මහජනතාවගේ දැනුවත් භාවය වැඩි දියුණු කිරීම සිදු කරනු ලබයි.

### 3.2 බලපෑමට ලක් වූ ප්‍රදේශ සහ ජනතාව පිළිබඳ සාරාංශය

කඳුකරයේ නාගරික ප්‍රදේශයන්වල පවතින ඉහළ මානව ජනාවාස හා යටිතල පහසුකම් ව්‍යාප්තිය හේතුවෙන් නාය යෑම්වලින් සිදුවන අහිතකර ආර්ථික බලපෑම ඉතා ඉහළ මට්ටමක පවතී. කෘෂිකාර්මික කටයුතුවල ව්‍යාප්තිය සහ නිවැරදි සැලසුම්කරණයකින් තොර සංවර්ධන කටයුතු හා ජනාවාස

ව්‍යාප්තිය හේතුවෙන් නාය යෑම් අවදානම වර්ධනය වීමක් දක්නට ලැබේ. 2016 වර්ෂයේදී සිදු වූ නාය යෑම් හේතුවෙන් පවුල් 4000කට බලපෑම් එල්ල කළ අතර පුද්ගල මරණ 50ක් වාර්තා විය. සම්පූර්ණ හානියට ලක් වූ නිවාස සංඛ්‍යාව 110කි. කෘෂිකාර්මික, වාණිජ හා කර්මාන්ත කටයුතු මත සිය ජීවනෝපාය මාර්ග පදනම් කරගත් පුද්ගලයින් දශ ලක්ෂයකට වඩා වැඩි පිරිසකගේ ආදායම් මාර්ග අහිමි විය. 2017 වර්ෂයේදී ප්‍රධාන නාය යෑම් සිදු වීම් 35ක් වාර්තා වූ අතර එම වර්ෂයේ ස්වාභාවික ආපදා හේතුවෙන් සිදු වූ පුද්ගල මරණ 219 අතරින් 176කට එම නාය යෑම් 35 හේතු විය. මෙම ආපදාවන්ට ලක් වූ පුද්ගලයින් සැලකිය යුතු මට්ටමේ දරිද්‍රතා මට්ටමක් සහිත පුද්ගලයන් වන අතර ඔවුන්ගේ සාමාන්‍ය දරිද්‍රතා අනුපාතය 11.1%කි. 2017 වර්ෂයේ සිදු වූ නාය යෑම් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නාය යෑම් අවදානම් සිතියම් මත පදනම්ව නැවත පදිංචි කිරීම සඳහා හඳුනා ගත් නිවාස 2131ක් හානියට පත් විය. අධි අවදානම් කලාපයන්හි පිහිටි හඳුනාගත් නිවාස ඒකක 15,000කට වඩා වැඩි ප්‍රමාණයක් නැවත පදිංචි කිරීම යෝජනා වී ඇත. වසර 2000 සිට 2010 දක්වා කාල සීමාව තුළ නාය යෑමේ සිදු වීම්වල බලපෑමට ලක්වූ, ජීවිත අහිමි වූ සහ හානි වූ නිවාස පිළිබඳ දත්ත පහත දක්වා ඇත.

වගුව අංක 04: 2000 සහ 2010 අතර නාය යෑම් සිදු වීම්වල බලපෑම


| වසර | බලපෑම් සිදු වූ පුද්ගලයින් ගණන | පුද්ගල මරණ | හානියට පත්වූ සහ විනාශයට පත් වූ නිවාස ගණන |
|---|---|---|---|
| 2000-2005 | 30,140 | 245 | 4450 |
| 2006-2010 | 59,778 | 106 | 5018 |

ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් නාගරික, ග්‍රාමීය හා වතු වශයෙන් ශ්‍රී ලංකාවේ ජනාවාස කොටස් තුනකට වර්ග කර ඇත. එම වර්ගීකරණය සිදු කිරීමේදී ඔවුන්ගේ සමාජ, ආර්ථික හා දේශපාලනික ගති ලක්ෂණ මත පදනම් සිදු කර ඇති බැවින් එම කුටුම්භයන්හි ගුණාංග, ඉඩම් භාවිතය සහ ජනාවාසයන්ගේ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා මෙම වර්ගීකරණය ඉතා වැදගත් වේ. මහනගර සභා හෝ නගර සභා බල ප්‍රදේශයන්ට අයත් ප්‍රදේශ නාගරික ප්‍රදේශ ලෙසත් ශ්‍රමිකයින් 10කට නො අඩු සහ අක්කර 20කට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් සහිත වතු වගා ප්‍රදේශ වතු අංශය යටතටත් ලෙසත් ගැනේ. වතු හෝ නාගරික අංශයට අයත් නොවන අනෙකුත් නේවාසික ප්‍රදේශ ග්‍රාමීය අංශයට අයත් වේ. ගෘහ ඒකකයක තරම පිළිබඳ නිර්වචනය යටතට තාවකාලික පදිංචිකරුවන්, සේවකයන් ඇතුළු සාමාන්‍යයෙන් නිවසක් තුළ ජීවත් වන පුද්ගලයින් සංඛ්‍යාව ඇතුළත් වේ. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව 2016 වර්ෂයේදී ගෘහ ඒකකයක සිටින පුද්ගලයින් සංඛ්‍යාවේ මධ්‍යන්‍ය අගය පුද්ගලයින් 3.8 කි.

## 4. සමාජ කළමනාකරණ හා නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුවේ අරමුණු

මෙම ලේඛනය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සමාජ ආරක්ෂණ පියවරයන් සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට, නියෝජිතායතන (ජා.ගො.ප.ස) වෙත අවශ්‍ය මග පෙන්වීම් සිදු කිරීමේ අරමුණින් සමාජ කළමනාකරණ හා නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුවක් සකස් කරනු ලබයි. මෙම ප්‍රතිපත්ති රාමුව තුළ සාමාන්‍ය සමාජ කළමනාකරණ සැලැස්මක් (SMP) සහ සමාජ කළමනාකරණ පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශයන් අන්තර්ගත වේ. එක් එක් වැඩබිම් සඳහා සමාජ බලපෑම් ඇගයීම (SIA) සහ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම (ESMP) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම, මෙම ප්‍රතිපත්ති රාමුව කාර්ය භාරයයි. AIIB ප්‍රතිපත්ති අවශ්‍යතාවන් සහ ශ්‍රී ලංකා රජයේ නීති හා රෙගුලාසි අතර එකඟතාව පවත්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම භාවිත කරනු ඇත. ව්‍යාපෘතියේ සෑම අදියරයකදීම පාරිසරික හා සමාජයීය බලපෑම හඳුනා ගැනීම, ඇගයීම හා කළමනාකරණය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට අවශ්‍ය සහයෝගය ලබාදීමට මෙම සැලැස්ම උපකාරී වනු ඇත. ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් තුළින් අහිතකර සමාජයීය බලපෑමක් සිදු නොවන බව තහවුරු කර ගැනිම සඳහා ද මේ තුළ විධි විධාන අන්තර් ගත කර ඇත. ඊට අමතරව, ව්‍යාපෘතියට අදාළ එහෙත් අනපේක්ෂිත සමාජ ආරක්ෂණ ගැටලු කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය සාර්ව මට්ටමේ මාර්ගෝපදේශනයන් ද මේ තුළ සපයා ඇත. තවද, මෙම සමාජ කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුව විසින් අත්‍යවශ්‍ය ඉඩම් පරිහරණ සැලසුම්කරණ සහ ඉඩම් කළමනාකරණ නියෝජිතායතන අතර අන්තර් සම්බන්ධතාවක් ගොඩනැගීමද සිදු කරනු ඇත.

## යෝජිත සමාජ කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව




නායයාම් අවම කිරීමේ පියවරයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියට සම්බන්ධිත පුද්ගලයන්ට විඳීමට සිදුවිය හැකි පාරිසරික, සමාජ ආර්ථික, සංස්කෘතික හා භෞතික වශයෙන් පීඩාවන් අවබෝධ කර ගැනීම සඳහා අනු ව්‍යාපෘතිවල පරිසර හා සමාජ බලපෑම් තක්සේරු කිරීම් (ESIA) සිදු කරනු ලැබේ. ව්‍යපෘති කළමනාකරණ ඒකකයේ සමාජ ආරක්ෂණ විශේෂඥයින් විසින් පාරිසරික සමාජ ආරක්ෂණ බලපෑම් තක්සේරුකරණය සිදු කරනු ලබයි. මෙම තක්සේරුකරණ ක්‍රියාවලිය, ව්‍යාපෘතියේ මූලික සැකසුම් හා වැඩ කටයුතුවලට පෙර සිදු කළ යුතු අතර අත්‍යවශ්‍ය සමාජ කළමනාකරණ සහ අවදානම් අවම කිරීමේ පියවරයන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර ක්‍රියාත්මක කළ යුතුය.

## 5. ව්‍යාපෘතිය තුළින් සිදුවිය හැකි අහිතකර සමාජ බලපෑම්

පුළුල්ව හඳුනා ගෙන ඇති ආකාරයට අවදානම් අවම කිරීමේ පියවරයන් ප්‍රධාන කාණ්ඩ තුනකි. පළමු කාණ්ඩයඃ නාය යෑම් සිදුවන ප්‍රදේශයන්ගේ ජලාපවහන කළමනාකරණය කිරීම සඳහා කාණු පද්ධති වැඩි දියුණු කිරීම. දෙවන කාණ්ඩයඃ බෑවුමේ ස්ථායීතාව වැඩි දියුණු කිරීම සඳහා බෑවුම් නවීකරණ කටයුතු. තෙවන කාණ්ඩයඃ දිගු කාලීන බෑවුම් ස්ථායිකරණය සඳහා නාය යෑම් පාලන පියවරයන්. මෙම ව්‍යපෘතියට අදාළ හඳුනාගත් නාය යෑම් සහිත ස්ථානයන්හි අවදානම අවම කිරීමේ ක්‍රියාකාරකම් හේතුවෙන් තාවකාලිකව වෙනත් ස්ථානයන්හි පදිංචි කිරීම් සහ ගොඩනැගිලි, ඉඩම්, ව්‍යුහයන්, ආදායම් මාර්ග, ඵලදායී යටිතල පහසුකම්, වගා කටයුතුවලට හානි වීම් වැනි ප්‍රධාන සමාජයීය බලපෑම් සිදු විය හැකිය.

වගුව අංක 05ඃ සිදු විය හැකි බලපෑම් හා හානි

| වර්ගය | හානි සිදුවිය හැකි ආකාරය |
|---|---|
| තනි පුද්ගලයින්ට හෝ කුටුම්භයන්ට | • කුටුම්භයන්ට අයත් දේපොළ |
| ඉඩම් | • කෘෂි කාර්මික හෝ ගෙවතු ඉඩම්<br>• නිවාස ඒකක<br>• ව්‍යාපාරික ඒකක<br>• හිස් ඉඩම් |
| ව්‍යුහයන් | • නිවාස හෝ ව්‍යාපාරික ගොඩනැගිලි පූර්ණ හානි වීම්<br>• නිවාස හෝ ව්‍යාපාරික ගොඩනැගිලි අර්ධ හානි වීම්<br>• කුලී නිවාස හෝ වෙනත් කටයුතු සඳහා යෙදවූ නිවාසවලින් ඉවත් වීමට සිදු වීම<br>• කුලී නිවාස හෝ වෙනත් කටයුතු සඳහා යෙදවූ ව්‍යාපාරික ගොඩනැගිලිවලින් ඉවත් වීමට සිදු වීම |
| ආදායම් සහ ජීවනෝපාය | • කෘෂිකාර්මික කටයුතුවලින් ලැබෙන ආදායම් (වාර්ෂික හෝ බහුවාර්ෂික භෝග සහ/හෝ පශු සම්පත්)<br>• නිවාස කුලී ආදායම්<br>• වෙනත් ව්‍යුහයන් කුලියට දීමේ ආදායම්<br>• වේතන වශයෙන් ලැබෙන ආදායම්<br>• ලැබිය හැකි අදායම්/ රැකියා අවස්ථා |
| ප්‍රවේශය වීමේ මාර්ග අහිමි වීම් | • රෝහල්, පාසල් සහ ආගමික ස්ථාන වෙත ප්‍රවේශ වීමේ මාර්ගයන්<br>• ජංගම වෙළෙන්දන්ට ප්‍රවේශ වීමට ඇති මාර්ගයන්<br>• විදුලිය හා ජලය සඳහා ඇති ප්‍රවේශයන් |
| සන්නිවේදන හා සංස්කෘතික වැඩබිම් | • පාසල්. ප්‍රජා මධ්‍යස්ථාන, ආගමික සංකේත<br>• ආගම් ඇදහීමේ ස්ථාන - පල්ලි, පන්සල්, මුස්ලිම් පල්ලි<br>• සුසාන භූමි<br>• අසල්වාසීන්ගෙන් දුරස්ථ වීම<br>• සමාජ/ ජනවාර්ගික කණ්ඩායම්වලින් දුරස්ථ වීම්<br>• සාමූහික ජීවන තත්ත්වයන් |

## 6. සමාජ බලපෑම් අවමකිරීම සඳහා මූලධර්ම හා මාර්ගෝපදේශ

සමාජ කළමනාකරණ සහ නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුව තුළින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන්ට ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ කළමනාකරණ කිරීමේදී සමාජ ආරක්ෂණ කටයුතු පිළිබඳ ප්‍රමාණවත්ව මැදිහත් වීමට අවශ්‍ය හැකියාව ලබාදීම සිදු කෙරේ. එක් එක් අනු ව්‍යාපෘතිවල සඳහා පාරිසරික සහ සමාජ කළමනාකරණ ඇගයීමක් සහ පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමත් සමග සමාජ බලපෑම් අවම කිරීමේ මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීම ආරම්භ වනු ඇත. සමාජීය බලපෑම් අවම කිරීම සඳහා වන සමස්ත වියදම අනු ව්‍යාපෘතිවල මුළු පිරිවැයට ඇතුළත් වේ. SMRPF හි යෝජිත සමාජයීය බලපෑම් අවම කිරීමේ පියවරයන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන පදනම් කර යුතු මූලධර්ම පහත දක්වා ඇත.

වගුව අංක 6: සමාජීය බලපෑම් අවම කිරීම සඳහා යෝජිත මූලධර්ම සහ මාර්ගෝපදේශ

| **මූල ධර්ම** | **මාර්ගෝපදේශ** |
|---|---|
| **මූල ධර්මය 01:**<br>ව්‍යාපෘතියට අදාළ හේතුවක් මත තාවකාලිකව හෝ ස්ථිරව සහ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් පුද්ගලයින් වෙනත් අවතැන්වීමක් සිදු නොවිය යුතුය | • නැවත පදිංචි කිරීම්/ නැවත පදිංචි කිරීමේ අවශ්‍යතා ඇගයීම<br>• එලදායී ඉඩම්, ආර්ථික වත්කම් සහ සංස්කෘතික වටිනාකම්වලට සිදුවිය හැකි බලපෑම් අවම කිරීමට හෝ මගහැරීමට නායයාම් අවම කිරීමේ ඉංජිනේරු සැලසුම් භාවිතය |
| **මූල ධර්මය 02:**<br>හදිසි ඉවත් කිරීම් හා පෙර සූදානම් වීමේ සැලසුම් | • ස්ථානීය විශේෂිත අවදානම් ඇගයීම සහ අවදානම් සංරචක හඳුනා ගැනීම් සිදු කිරීම<br>• ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය මත හදිසි ඉවත් කිරීමේ සැලසුම් සහ ආපදා පෙර සූදානම් වීමේ සැලසුම් සකස් කිරීම.<br>• හදිසි ඉවත් කිරීමේ හා ආපදා පෙර සූදානම් වීම පිළිබඳ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| **මූල ධර්මය 03:**<br>හානි සහ පාඩු කළමනාකරණය සහ අධීක්ෂණය | • පහත තොරතුරු ඇතුළත්ව ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ සියලුම පවුල් පිළිබඳ අවකාශීය දත්ත සංචිතයක් නිර්මාණය කළ යුතුය.<br>• ඉඩම් භුක්තිය; නැවත ලබා දිය නොහැකි වන ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් ව්‍යුහයන් |

| | |
|---|---|
| | සඳහා නැවත පදිංචි කිරීමේ වටිනාකම සහ හා නාය යෑම් අවමකරණ පියවරයන්ගෙන් වටිනාකම් අනුව වන්දි ගෙවීම් තීරණය කිරීම.<br>• පවුල්වල වර්තමාන ආදායම සහ ජීවනෝපාය මාර්ග.<br>• මෙම සියලු දත්ත ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ නිරීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ කටයුතුවලට පයසු වන පරිදි දත්ත සංචිතයක් තුළට ඇතුළත් කරනු ඇත. |
| **මූල ධර්මය 04:**<br>ප්‍රජාව දැනුවත් කිරීම සහ ප්‍රජා සහභාගිත්වය | • ව්‍යාපෘතියේ ශක්‍යතා අදියරයේදී තොරතුරු ප්‍රසිද්ධ කිරීම හා බෙදා හැරීම සිදු කරනු ලබයි.<br>• නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට පෙර සමාජ බලපෑම් ඇගයීමේ ප්‍රතිඵල බෙදා හැරීම.<br>• ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර හිමිකම්, වන්දි, ගෙවීම් කිරීමේ ක්‍රමවේදය සහ දුක් ගැනවිලි සම්බන්ධ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කිරීම හා බෙදා හැරීම.<br>• පහත සඳහන් දෑ කෙරෙහි විශේෂ අවධානයක් දෙනු ලැබේ:<br>  ▪ ව්‍යපෘතියේ ස්වභාවය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.<br>  ▪ තම නිවාස සහ ජීවනෝපාය ක්‍රමයන් යළි ස්ථාපිත කිරීම පිළිබඳව සහ ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ සහභාගිත්වය තහවුරු කිරීම පිළිබඳව ප්‍රජා දැනුවත් කිරීම<br>  ▪ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර නැවත පදිංචි කිරීමේ හා ඉඩම් අත්පත් කර ගැනීමේ කාල රාමුව පිළිබඳ ප්‍රමාණවත් ඉදිරි කාල සීමාවක් සහිතව බලපෑමට ලක් වූ ජනතාව දැනුවත් කිරීම. |

| | |
|---|---|
| | ▪ ව්‍යාපෘතියට අදාළ වැඩබිම්, ජා. ගො. ප. ස. දිස්ත්‍රික් කාර්යාල සහ පළාත් පාලන ආයතන තුළ තොරතුරු ප්‍රදර්ශනය කිරීම.<br>▪ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා ලියාපදිංචි සිවිල් සංවිධානවලින් සහය ලබා ගැනීම. |
| **මූල ධර්මය 05:**<br>සමාජ මැදිහත් වීම තහවුරු කිරීම. | • කාන්තාවන්ගේ සහභාගීත්වය දිරිගැන්වීම.<br>• වයෝවෘද්ධ හා ආබාධිත පුද්ගලයින් ඇති හෝ ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන වෙනස්කම්වලට ගොදුරුවිය හැකි හෝ ප්‍රතිලාභ ලැබීමෙන් හෝ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි විය හැකි කාන්තාවන් ගෘහ මූලික පවුල් මත විශේෂ අවධානයක් යොමු කරමින් ගොදුරු විය හැකි පවුල් හා කණ්ඩායම් හඳුනා ගැනීම. |
| **මූල ධර්මය 06:**<br>ව්‍යාපෘතිය අවසාන වන විට පීඩාවට පත් වූ පවුල්වලට ඔවුන්ගේ පෙර පැවති මට්ටමට වඩා සමාන හෝ වැඩි ජීවන තත්ත්වයන් ලැබෙන පරිදි බලපෑමට ලක්වන පවුල් යථා තත්ත්වයට පත් කිරීම. | • ඉඩම් සහ වත්කම්වලට සිදුවන අලාභය හා හානිය ප්‍රතිස්ථාපනය කිරීමට හැකි වන පරිදි ලද වන්දි ගෙවීම.<br>• විනාශ වූ හෝ හානියට පත් නිවාස/ වෙළඳසැල් හෝ වෙනත් ව්‍යුහයන් ප්‍රතිෂ්ඨාපන පිරිවැය යටතේ නැවත ගොඩනැඟීම සඳහා මුදල් සහ/ හෝ විකල්ප ඉඩම් සහ/ හෝ ගොඩනැගිලි ස්ථාපිත කිරීමට සහය වීම.<br>• ජීවනෝපාය මාර්ග ප්‍රතිස්ථාපනය හා ප්‍රජා සංවර්ධනය සඳහා සහය වීම. |
| **මූල ධර්මය 07:**<br>AIIB සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සහ නෛතික සහ ප්‍රතිපත්තිමය විධිවිධානවලට අනුකූලව සමාජයීය බලපෑම් අවම කිරීම සඳහා වූ පියවර ගැනිම | නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතියේ ප්‍රතිපත්තිවලට, අදාළ ජාතික ව්‍යවස්ථාමය ප්‍රතිපත්තිවලට සහ පහත දැක්වෙන AIIB සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිවලට, අනුකූල විය යුතුය.<br>• සමාජ කළමනාකරණය;<br>• මහජන සහභාගීත්වය සහ තොරතුරු ප්‍රසිද්ධ කිරීම |

| | |
|---|---|
| | • ඉඩම් භුක්තිය, භාවිතය, අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම, සහ<br>• පළාත් පාලන, සංවර්ධන සහ සේවා සැපයීම්. |
| **මූල ධර්මය 08:**<br>නැවත පදිංචි කිරීමේ වැඩබිම්වල ස්ථාවර ස්වයං පාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | • බලපෑමට ලක්වන කණ්ඩායම්වල සමාජ සම්බන්ධතා ජාලයන් සඳහා අහිතකර බලපෑම් සිදු නොවන බව තහවුරු කර ගැනීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා සහභාගිත්ව ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි. ඒ සඳහා ලියාපදිංචි සිවිල් සංවිධාන හා ප්‍රජා පාදක සංවිධාන උපදෙස් ලබා දෙනු ඇත<br>• නැවත පදිංචි කළ ගෘහ ඒකකවල කළමනාකරණ කමිටු සඳහා ශක්‍යතා වර්ධනය කිරීමට පහසුකම් සැපයීම.<br>• ළමුන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ප්‍රජා ශාලා, එළිමහන් අවකාශ, ජලාපවහන පද්ධති හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළු මූලික පහසුකම් සහ සේවාවන් සැපයීම. |

## 07. නාය යෑම් අවමකරණ වැඩසටහනෙන් බලපෑම් සිදු වන පුද්ගලයින්ට වන්දි ගෙවීම

මෙම ව්‍යාපෘතියට අදාළ කටයුතු හේතුවෙන් පුද්ගලයින් නැවත පදිංචි කිරීමට සිදු වීම අවමකිරීමට ඉතා ඉහළ අවධානයක් යොමු කරන නමුත් ඇතැම් අවස්ථාවලදී තාවකාලික අවශ්‍යතාවන් සඳහා පුද්ගලයින් වෙනත් ස්ථානයන් වෙත පදිංචි කිරීම් සිදු විය හැකිය. එබැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අදියරයේදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් තාවකාලිකව නැවත පදිංචි කිරීමට සිදුවන පවුල් සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ඉඩම් ලබා ගැනීමට සිදු වන ඉඩම් හිමියන් සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුවේ. එම ගිවිසුමේ ආකෘතියක් ඇමුණුම 2 හි දැක්වේ. තවද, ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් යම් පුද්ගලයෙකු සතු ගොඩනැගිලි, ඉඩම්, වෙනත් ව්‍යුහයන්, ආදායම් මාර්ග, ඵලදායී යටිතල පහසුකම් සහ කෘෂිකාර්මික කටයුතු අහිමි වීමකදී හෝ ඒවාට හානි සිදු වීමකදී, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුකූලව වර්තමාන වෙළෙඳපොළ වටිනාකම අනුව වන්දි ගෙවීම් සිදු කරනු ලැබේ. ප්‍රධාන තක්සේරුකරු විසින් හෝ ඔහු විසින් නම් කරනු ලබන රාජ්‍ය තක්සේරුකරණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු විසින් මෙම වන්දි මුදල් තක්සේරු කිරීම කළ යුතුය. මෙම වන්දි ගෙවීම් තීරණය කිරීම සඳහා වන්දි ගෙවීමේ කමිටුවක් ස්ථාපිත කරනු ලබයි. එම කමිටුවේ සාමාජිකයින් පහත දැක්වේ.

- අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) - සභාපති
- ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්
- මැනුම්පති හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකු
- ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහුගේ නියෝජිතයකු
- ව්‍යාපෘති අධ්‍යක්ෂ
- ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ විශේෂඥයෙකු
- 

වගුව 07. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශවල පදිංචි පවුල්වලට හිමිවන ප්‍රතිලාභ සහ එම ප්‍රතිලාභ හිමිවීමට සුදුසුකම් ලැබීමේ නිර්ණායක පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | හානි වර්ගය | බලපෑමට ලක්වන පුද්ගලයින් | හිමිකම් | විස්තරය |
|---|---|---|---|---|
| **1. ව්‍යුහයන් නොමැති පුද්ගලික ඉඩම් (ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගත හැකි)** | | | | |
| 1.1 | ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් හේතුවෙන් අහිමි වන ඉඩම් | ඉඩම් හිමිකරුවන්/ බලපෑමට ලක්වූවන් තම අයිතිය නෛතිකව තහවුරු කළ යුතුය | ප්‍රතිස්ථාපනය සඳහා වන්දි ගෙවීම | 1.1.1. බලපෑමට ලක් වූ ඉඩම් සඳහා පවතින වෙළෙඳපොළ වටිනාකම අනුව වන්දි ලබා දීම.<br>1.1.2.ස්ථාවර බෝග සඳහා මාස තුනක පෙර දැනුම් දීමක් හෝ වගා හානියට වන්දි ලබා දීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 1.1.3.බලපෑමට ලක් වූ ශාඛ සඳහා වර්තමාන වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ලබා දීම.<br>1.1.4. ආර්ථික වටිනාකමක් නොමැති ශේෂ වූ ඉඩම් සඳහා වන්දි ලබා දීම. |
| 1.2 | බදු කුලී පදනම මත ලබා දීම හෝ වෙනත් ලාභදායී කටයුත්තක යෙදීමට නොහැකි වීම | ලියාපදිංචි කුලී නිවැසියන්, බදු හිමියන් සහ හිමිකම් නොමැති භාවිතා කරන්නන් | ස්ථාවර බෝග හෝ ආදායම් මාර්ග අහිමි වීම් සඳහා වන්දි ලබා දීම | 1.2.1. ඉඩම් සඳහා වන්දි ලබා නොදේ.<br>1.2.2. බදු කුලී මත වගා කර ඇත්නම් ස්ථාවර බෝග ආරක්ෂා කර ගැනීම සඳහා තුන් මාසයකට පෙර දැනුම් දීම හෝ වෙළෙඳ පොළ වටිනාකම අනුව හානිය සඳහා මුදල් ගෙවීම<br>1.2.3. බලපෑමට ලක් වූවන්ට මාස හයක කාලයක් සඳහා මුදල් ගෙවීමක් සිදු කිරීම. |
| **2. වාණිජ ඉඩම් සහ ව්‍යුහයන්** | | | | |
| 2.1 | ස්ථිර හා පූර්ණ වශයෙන් වානිජ දේපල අහිමි වීම | ලියාපදිංචි ව්‍යාපාරයක හිමිකරු/ පවත්වාගෙන යන්නා සිය හිමිකම හෝ බලපත්‍රය<br><br>රැකියාව අහිමි වන සේවකයින් | වෙළෙඳපොළ වටිනාකම අනුව වන්දි ගෙවීම | 3.1.1. වර්තමාන වෙළෙඳපොළ වටිනාකම අනුව ඉඩම් සඳහා වන්දි ලබා දීම.<br>3.1.3 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි අනුව ප්‍රවාහන දීමනාවක් ලබා දීම.<br>3.1.4. වෙනත් ස්ථානයකට විතැන් වීමට සිදු වීමකදී, 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි වලට අනුව මාස හයක කාලයකට විකල්ප කුලී නවාතැනක් සඳහා මූල්‍ය දීමනාව<br>3.1.5 පූර්ව වසර 3ක කාලයක ශුද්ධ වාර්ෂික ලාභය මත පදනම්ව මාස හයක කාලයක් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සඳහා ශුද්ධ ලාබයට සමාන දීමනාවක් හෝ 2008 ඉඩම් අත්පත් කර ගැනීමේ රෙගුලාසි අනුව දීමනාවක් ලබාදීම යන අවස්ථා දෙකින් වැඩි අගය දීමනාවක් ව්‍යාපාරය නැවත ගොඩනැගීම සඳහා ලබා දේ. 3.1.7 රැකියාව අහිමි වන සේවකයින්ට මාස හයක කාලයක් සඳහා වැටුප් ලබා දීම. |
| **3. ජීවනෝපාය අහිමි වීම්** | | | | |
| 3.1 | තාවකාලිකව සිදු කරන නැවත පදිංචි කිරීම් නිසා ජීවනෝපාය මාර්ග අහිමි වීම | තාවකාලිකව සිදු කරන නැවත පදිංචි කිරීම හේතුවෙන් තම ආදායම් අහිමි වන ගොදුරු විය හැකි සහ කාන්තාවන් ගෘහ මූලික වන පවුල් ඇතුළු සියළුම පවුල් | පුනරුත්ථාපන සහයෝගීතාව | 4.1.5 පූර්ව වසර 3ක කාලයක ශුද්ධ වාර්ෂික ලාබය මත පදනම්ව මාස හයක කාලයක් සඳහා ශුද්ධ ලාබයට සමාන දීමනාවක් හෝ 2008 ඉඩම් අත්පත් කර ගැනීමේ රෙගුලාසි අනුව දීමනාවක් ලබාදීම යන අවස්ථා දෙකින් වැඩි අගය දීමනාවක් ව්‍යාපාරය නැවත ගොඩනැගීම සඳහා ලබා දේ. |
| **4. තාවකාලික බලපෑම්** | | | | |
| 4.1 | පොදු කටයුතු (ප්‍රවේශ මාර්ග අහිමි වීම, දේපොළ හා ඉඩම් හානි, ආරක්ෂාව පිළිබඳ උවදුරු, ගමනාගමන බලපෑම) සඳහා සිදු වන තාවකාලික අහිතකර බලපෑම් | කුටුම්භ/ ව්‍යාපාර ඒකක | අවමකරණ පියවරයන් | 5.1.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම: ක්‍රියාකාරකම් පෙළ ගැස්ම, සිදුවිය හැකි තාවකාලික බලපෑම්, දැන්වීම්, ආරක්ෂණ උපදෙස් හා හානි අවම කිරීමේ ක්‍රම, භාර නිලධාරියාගේ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු. 5.1.2. ගමනාගමන කටයුතු සඳහා පහසුකම් සැපයීමට අත්‍යවශ්‍ය රථවාහන කළමනාකරණය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 5.1.3. ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රවේශ මාර්ග සැපයීමට විශේෂිත පියවරයන්<br>5.1.4. යම් අවස්ථාවක රථවාහන ගමනාගමනය බාධා වීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු අඩාල වන්නේ නම් බලපෑමට ලක්වන පාර්ශවය හා දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව අතර එකඟතාව මත යථා තත්ත්වයට පත්වන තෙක් මූල්‍යමය දීමනාවක් ලබා දීම. යම් අවස්ථාවක පදිකයින්ට ගමනාගමන බාධාවක් ඇති වීමකදී කොන්ත්‍රාත් කරු විසින් විකල්ප මාර්ගයක් සැපයිය යුතුය.<br>5.1.5. කොන්ත්‍රාත්කරුගේ අත්වැරදීමක් මත යන්ත්‍ර භාවිතයේදී හෝ ස්ථාපිත කිරීමේදී ඉදිකිරීම් මත හෝ ව්‍යුහයන් මත හානි වීමකදී කොන්ත්‍රාත්කරු විසින් වන්දි ගෙවිය යුතුය.<br>5.1.6 යෝජිත ඉදිකිරීම් සඳහා යෝජිත මාර්ග හැර අනෙකුත් තාවකාලික ව්‍යාපෘති කටයුතු සඟා භාවිත කිරීමේදී ඉඩම් හිමිකරු සහ කොන්ත්‍රාත්කරු අතර ලිඛිත අවසරයක් ලබා ගත යුතුය. ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන්හි උපදෙස් මත ඉදිකිරීම් වැඩබිම්වල තාවකාලික |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වාසස්ථාන පිහිටුවීම සිදු කළ යුතුය.<br>5.1.7. පාරිසරික කළමණාකරණ සැලැස්මේ කොටසක් ලෙස අවශ්‍ය සෞඛ්‍ය හා ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීම. ශබ්දය හා දූවිලි පාලනය, හදිසි අනතුරු වළක්වා ගැනීමට අනතුරු ඇඟවීමේ පුවරු හා ආරක්ෂිත බාධක, ප්‍රථමාධාර පහසුකම් සැපයීම<br>5.1.8. නිරන්තර මිනිසුන් සහ රථවාහන සංසරණය හේතුවෙන් සිදු විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පියවර ගැනීම<br>5.1.9. කාන්තා හා පිරිමි ශ්‍රමිකයින් අතර වැටුප් සමානත්වය හා ළමා ශ්‍රමිකයින් යොදා නොගැනීම යන නෛතික විධිවිධාන අනුගමනය කිරීම<br>5.1.10. හදිසි අවස්ථාවලදී ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ විධිවිධාන |

*මූලාශ්‍රය: 1950 අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත*

## 8. නෛතික රාමුව

යෝජිත ව්‍යාපෘතියේ සියලුම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා රජයේ නීති, රෙගුලාසි සහ අනෙකුත් විධිවිධානයන්ට අනුකූලව සිදු කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායනයන් විසින් එම නෛතික හා රෙගුලාසි රාමුව මත ව්‍යාපෘති ක්‍රියාකරකම් සිදු වන බව තහවුරු කළ යුතුය. මෙම ජේදයෙහි දක්වනු ලබන්නේ යෝජිත ව්‍යාපෘතියට අදාළ වන ජාතික ප්‍රතිපත්ති, රෙගුලාසි සහ සැලසුම් මූලධර්මයන්ය.

### අ) 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත

2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමණාකරණ පනත මගින් රට තුළ ඇති ආපදා අවදානම් කළමනාකරණ ආයතනික ව්‍යුහය සකස් කිරීම සඳහා අවශ්‍ය නීතිමය පදනම සපයන ලදී. පනත මගින් ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාව නම් ආයතනයක් පිහිටු වූ අතර එම සභාවේ උපදෙස් මත පවතින හෝ නුදුරේදී ඇතිවිය හැකි ආපදා තත්ත්වයකදී ''ජාතික ආපදා තත්ත්වයක්'' ප්‍රකාශයට පත් කිරීමට ජනාධිපතිවරයාට බලය පවරා ඇත. එවැනි තත්ත්වයකදී සාමාන්‍ය තත්ත්වය අනුව භාවිත කළ නොහැකි සම්පත් භාවිත කිරීමට පරිපාලන ඒකකයන්ට බලය හිමි වේ. ආපදා කළමනාකරණ පනත මගින් ජාතික සභාවට, i) ආපදා වැළැක්වීම සහ අවම කිරීම සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, ආපදා සහන සේවා, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ විධිවිධාන ii) ආපදා තත්ත්වයට ගොදුරුවන, අවදානම් අවම කිරීම හා ආපදාවන්ට අදාළ කටයුතු කරන පුද්ගලයින් සහ ආයතන අතර සම්බන්ධීකරණය, ක්‍රියාකාරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආපදා අවමකරණයට අදාළ වැඩසටහන් සහ අධ්‍යයන මෙහෙය වීම සඳහා බලය පවරා ඇත. ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා පවතින ප්‍රමුඛතම ප්‍රතිපාදනයකි. භෞතික සැලසුම් සහ පළාත් පාලනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිවලට හා මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉඩම් පරිහරණය, ස්වේච්ඡාවෙන් නැවත පදිංචි වීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු වලදී ආපදා අවදානම් අවම කිරීමට එය ක්‍රියාත්මක වේ.

2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනතට අනුව ජනාධිපතිවරයා විසින් සභාපතිත්වය දරනු ලබන ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාව, විසින් ආපදා තත්ත්වයන් පවතින ස්ථාන ව්‍යාපෘති වැඩබිම් ලෙස ප්‍රකාශයට පත්කරන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කිරීමට සුදුසු සංවිධානයක් පත් කිරීමටද උපදෙස් ලබා දීම සිදු කෙරේ.

### ආ) 1950 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සහ 2008 ඉඩම් අත්පත් කර ගැනීමේ රෙගුලාසි

රාජ්‍ය ව්‍යාපෘති සහ සංවර්ධන කටයුතු ඇතුළු පොදු අරමුණු වෙනුවෙන් පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ විධිවිධාන මෙහි ඇතුළත් වේ. මෙම පනත සඳහා සිදු කර ඇති අවසාන සංශෝධනය වන්නේ 1986 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත් සංශෝධනය මගිනි. 2008 ඉඩම් අත්පත් කර ගැනීමේ රෙගුලාසි මගින් ඉඩම් අත්පත් කර ගැනීමේ රාමුවක් සපයනු ලබයි. ඊට අනුව මෙම රෙගුලාසිවලට පටහැනි ආකාරයට කිසිදු පුද්ගලයෙකුට ඉඩම් අත්පත් කර ගත නොහැකි වේ. නෛතික රාමුව මගින් අනවශ්‍ය ආකාරයට ඉඩම් අත්පත් කරගැනීම් වළක්වා ඇත. නාය යෑම් අවමකරණ ව්‍යාපෘතිය මගින් නැවත පදිංචි කිරීම් හා ඉඩම් අත්පත් කරගැනීම් අවම කිරීමට අපේක්ෂා කරනු ලබයි.

**ඇ) ජාතික ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය**

මෙම ප්‍රතිපත්තියේ මූලික අරමුණ වන්නේ නැවත පදිංචි කිරීම් හේතුවෙන් පුද්ගලයින් දරිද්‍රතාවට පත්වීම වැළැක්වීම තහවුරු කර ගැනීම සඳහා ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීම් වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි. මීට පෙර ක්‍රියාත්මක කළ නැවත පදිංචි කිරීමේ වැඩසටහන් පුද්ගලයින්ගේ සමාජ ආර්ථික අවභ්‍යතාවන් පිළිබඳව ප්‍රමාණවත්ව අවධානය යොමු නොකිරීම හේතුවෙන් අසාර්ථකත්වයට පත්ව ඇත (NIRP, 2001). ජාතික ස්වේච්ඡානුගත නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියට (2001) අනුව නැවත පදිංචි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය මූලධර්ම 13ක් ඉදිරිපත් කර ඇත.

1) යෝග්‍ය විකල්ප හඳුනා ගැනීම තුළින් ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීමේ අවශ්‍යතාව වැළැක්වීම හෝ අවම හැකි තරම් අවම කළ යුතු ය.

2) නැවත පදිංචිය සඳහා තෝරා ගත් පුද්ගලයින්ට ඔවුන්ගේ ජීවන මට්ටම යථා තත්ත්වයට ගෙන ඒමට සහ වැඩිදියුණු කිරීමට ප්‍රමාණවත් පරිදි සහය විය යුතුය.

3) ව්‍යාපෘතික්‍රියාවලිය පුරාම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ සාධාරණත්වය සහතික කළ යුතුය.

4) නැවත පදිංචි කිරීම සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයින් එම ක්‍රියාවලිය ආරම්භයේ සිටම සමස්ත ක්‍රියාවලිය පුරවටම ක්‍රියාකාරීව සහභාගී විය යුතුය. එහිදී නැවත පදිංචි කිරීමේ ස්ථාන තෝරාගැනීම, ජීවනෝපාය සංවර්ධනය සහ වන්දි ගෙවීමේ විකල්පයන් තීරණය කිරීම සඳහා නැවත පදිංචි වන්නන්ගේ අනිවාර්යායන් සහභාගී කර ගත යුතු ය.

5) අත්පත් කරගත් ඉඩමක් සඳහා වන්දි ගෙවීමේ විකල්පය, වෙනත් ඉඩමක් හෝ මුල්‍යමය ගෙවීමක් විය හැකිය.

6) අහිමි වන ඉඩම්, ගොඩනැගිලි, හෝ වෙනත් වත්කම් සහ ජීවනෝපාය මාර්ග සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි වන්දි ගෙවිය යුතුය.

7) ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි සහභාගිත්වය අනිවාර්යය වේ.

8) නැවත පදිංචි වන ආගන්තුක සමාජය වෙත ආර්ථික හා සමාජයීය වශයෙන් අනුගත වීමට අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය.

9) නැවත පදිංචි කරවන ජනතාව සඳහා අවශ්‍යය සමාජ හා භෞතික යටිතල පහසුකම් සැපයිය යුතුය.

10) නැවත පදිංචි කිරීමේ වැඩසටහන්, නැවත පදිංචි කරවන ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සහතික කිරීම සඳහා සිදු කරන සංවර්ධන කටයුත්තක් ලෙස සැලකිය යුතුය.

11) යම් පුද්ගලයකුට නීත්‍යානුකූලව අයත්ව නොතිබූ ඉඩමක් ඉඩම් අත්පත් කර ගැනීමේදී ඉඩම පරිහරණය කරන්නාට ඔවුන්ගේ ජීවන මට්ටම යථා තත්ත්වයට පත් කිරීම සඳහා සාධාරණ වන්දියක් ලබා දිය යුතුය.

12) නැවත පදිංචි කරන ජනතාව අතර අවදානම්වලට ගොදුරුවිය හැකි පුද්ගලයින් සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

13) වන්දි ගෙවීමේ සහ නැවත පදිංචි කිරීමේ මුළු පිරිවැය අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන විසින් දැරිය යුතුය.

**ඇ) 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත**

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනත ඒකාබද්ධ නාගරික සංවර්ධනය හා රට තුළ ආයෝජන ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතකි. අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති නිශ්චිත ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලිය සහ ඊට සම්බන්ධිත කටයුතු සඳහා ඒකාබද්ධ සැලසුම්කරණ සහ ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය ප්‍රවර්ධනය කිරීම  මෙම පනතේ විශේෂිත අරමුණයි. පනතට අනුව නම් කරන ලද නාගරික ප්‍රදේශ සඳහා විධිමත් සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීමේ වගකීම නාගරික සංවර්ධන අධිකාරියට පැවරේ. පනත මගින් ප්‍රකාශයට පත්කර ඇති නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම හා එම ප්‍රදේශයන්හි පාරිසරික ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කිරීමට කටයුතු කරනු ඇත. තවද, නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති හා පාරිසරික ප්‍රමිතීන් සංවර්ධනය සහ එම යෝජනා ක්‍රියාත්මක කිරීමත් විධිමත් කිරීමත් සිදු කරනු ලැබේ.

ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශයක් තුළ ඕනෑම සංවර්ධන කටයුත්තක් නියාමනය කිරීමේ අධිකාරි බලය  1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධන පනත මගින් නාගරික සංවර්ධන අධිකාරිය වෙතට පවරා ඇත. එබැවින් 1978 අංක 41 දරණ සංවර්ධන අධිකාරී පනතේ විධිවිධාන අනුව එවැනි සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතුය. අධිකාරියේ මෙහෙයවීම, අධීක්ෂණය හා පාලනය යටතේ සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබා දීමේ නෛතික බලය අධිකාරිය විසින් අදාළ පළාත් පාලන ආයතන වෙත පවරා දී ඇත. අධිකාරිය විසින් නම් කරන ලද සියලුම පළාත් පාලන ආයතනවල සැලසුම් කමිටු පද්ධතියක් ස්ථාපිත කර ඇත. එම කමිටු මගින් සියලු නවීකරණ කටයුතු සහ දැනට පවතින ව්‍යුහයන්ට විකල්ප ඉදිකිරීම් ඇතුළු සියලුම ඉදි කිරීම් සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථමව ඒවා පුළුල් ලෙස පරීක්ෂා කළ යුතුය. නාගරික සංවර්ධන ප්‍රදේශ තුළ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එම ප්‍රදේශයන් සඳහා යෝජිත නාගරික සංවර්ධන සැලැස්ම සමග අනුකූල වන පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

**ඉ) 1947 අංක 29 දරණ නගර සභා ආඥාපනත සහ 1939 අංක 66 දරණ නගර සභා ආඥාපනත**

පළාත් පාලන ආයතන සඳහා අදාළ ආඥාපනත් මගින් බලතල පවරා දී ඇත. පළාත් පාලන ආයතනයන්ට ''සිය බලප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය, මහජන උපයෝගීතා සේවා හා පොදු මංමාවත් සම්බන්ධ සියලුම තත්ත්වයන්  නියාමනය, පාලනය කිරීම හා පරිපාලනය කිරීමත් ජනතාවගේ සුවපහසුව, හා සුබසාධනය ඇතුළු සියලු ආකාරයේ පහසුකම්  සම්බන්ධයෙන් කටයුතු කිරීමත් පළාත් පාලන ආයතනවලට අයත් කාර්යයන් වේ.  (මහනගර සභා ආඥා පනත, 4 වන වගන්තිය; නගර සභා ආඥාපනත, 4 වන වගන්තිය; ප්‍රාදේශීය සභා පනත 3 වන වගන්තිය). මෙම නෛතික තත්ත්වය යටතේ නව ගොඩනැගිලි ඉදිකිරීම හා පවතින ගොඩනැගිලි නවීකරණය කිරීම සඳහා අදාළ පළාත් පාලන

ආයතනයේ අනුමැතිය ලබා ගත යුතුය. නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ ප්‍රකාශයට පත්කර ඇති මහනගර සභා සහ නගර සභා බලප්‍රදේශයන් තුළ නිවාස ඉදි කිරීමේදී හෝ සංවර්ධන කටයුතු සිදු කිරීමේදී අදාළ නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. තම පාලන බලප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු නියාමනය කිරීමේ බලය නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගරාධිපතිවරයා හෝ සහ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා වෙත පවරා ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ට අයත් නාගරික ප්‍රදේශ තුළ නිවාස ඉදිකිරීම හෝ වෙනත් සංවර්ධන කටයුතු සඳහා අදාළ ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ  අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ප්‍රදේශීය සංවර්ධන සැලසුම්කරණය සහ මනාව ඒකාබද්ධ වූ ග්‍රාමීය හා ප්‍රාදේශීය සැලසුම්කරණ පරිසරයක් නිර්මාණය කිරීමට පළාත්පාලන ආයතනයන්ගේ සහභාගිත්වය තහවුරු කරනු ලබයි.

මෙම ප්‍රතිපත්තිය මගින් තම පාලන බලප්‍රදේශය තුළ සැලසුම් බලධාරියා බවට පළාත් පාලන ආයතනය පත්කිරීම හරහා ජාතික භෞතික සැලසුම් නීතිය පිළිබඳ ප්‍රතිපත්තිය මනාව ක්‍රියාත්මක වන තහවුරු කර ඇත. ඒ අනුව පළාත් පාලන ආයතනයන්වලට තම බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම් හා සාධාරණ මානව සංවර්ධනයක් ඇති කිරීමට අදාළ සැලසුම් සකස් කිරීමේ බලතල පැවරී ඇත. එම තත්ත්වය ඔවුන් සතු විෂය පථය පුළුල් කිරීමට හේතුවේ. මෙම ව්‍යාපෘතියට අදාළව නාය යෑම් අවමකරණ පියවරයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රථමව අදාළ මහනගර හෝ නගර සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

නායයාමේ අවදානම අවම කිරීම සඳහා අනාගතයේ දී සිදුවිය හැකි බෑවුම් අස්ථාවරත්වයන්ගෙන් ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීමේ අරමුණින් බෑවුම්වල ඉදිකිරීම් කටයුතු සඳහා යම් යම් සීමාවන් පනවා ඇත. ඒ අනුව, බදුල්ල, ගාල්ල, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, මාතලේ, මාතර, නුවරඑළිය, රත්නපුර යන දිස්ත්‍රික්ක 10 හි හඳුනාගත් නාය යෑම් අවදානම් ඇති ප්‍රදේශයන්හි බෑවුම්වල ඉදිකිරීම් කටයුතු සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ එකඟතාවය ලබා ගැනීම අනිවාර්ය වේ.

## 9. දැනුවත් කිරීම සහ පාර්ශ්වකරුවන්ගේ දායකත්වය

ව්‍යාපෘතිය පිරිසැලසුම්කරණයේ හා ක්‍රියාත්මක කිරීමේ පළමු පියවර ලෙස බලපෑමට ලක්වන පුද්ගලයින් සමග සාකච්ඡා කිරීම හා ඔවුන් දැනුවත් කිරීම සිදු කළ යුතුය. එහිදී ජනතාව වෙත නිවරදි තොරතුරු සැපයීම තුළින් ව්‍යාපෘතිය පිළිබඳ දූර්මත නැති කිරීමටත් බලපෑමට ලක්වන ජනතාව අතර ව්‍යාපෘතිය පිළිබඳ විශ්වසනීයත්වය ගොඩනැගීම සහ ව්‍යාපෘතියේ විනිවිද භාවය වර්ධනය කළ යුතු ය. ව්‍යාපෘතිය පිළිබඳ සිදු කරන දැනුවත් වීමේ වැඩසටහන්වලදී තොරතුරු හුවමාරු කර ගැනීම, ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිචාරවලට ඇහුම්කන් දීම, තීරණ ගැනීමේ සාකච්ඡා සඳහා සම්බන්ද කර ගැනීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සහයෝගීතාව ලබා ගැනීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙම දැනුවත් කිරීමේ වැඩමුළු අකාර කිහිපයකට සිදු කළ හැකිය. *උදා: පොදු රැස්වීම් සංවිධානය කිරීම, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා, ගෘහ ඒකක සමීක්ෂණ හෝ තනි පුද්ගල දැනුවත් කිරීම්*

### 9.1 පාර්ශවකරුවන් පිළිබඳ විස්තරය

මෙම ව්‍යාපෘතියට අදාළ පාර්ශවකරුවන් යනු ව්‍යාපෘතිය පිළිබඳ ඍජු උනන්දුවක් දක්වන සහ දැනුවත් කිරීමේ ක්‍රියාවලියට සහභාගී විය හැකි පාර්ශවයන්ය. එම පාර්ශවකරුවන් ව්‍යාපෘතියේ ස්වභාවය මතත ප්‍රාථමික හා ද්විතීයික වශයෙන් කොටස් දෙකකට වර්ග කරනු ලබයි. ප්‍රාථමික පාර්ශවකරුවන් යටතට බලපෑමට ලක්වන පුද්ගලයින්, ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්, ධාරක ප්‍රජාව, ව්‍යාපෘති සහයෝගීතා නියෝජිතායතන (මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම්වරුන්, ආගමික නායකයින්, කලාප අධ්‍යාපන කාර්යාල වැනි ආයතන) සහ වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කලමනාකරණ අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය අයත් වේ.

ද්විතීයික පාර්ශවකරුවන් යටතට ව්‍යාපෘතිය පිළිබඳ උනන්දුවක් දක්වන පළාත් සභා හා පළාත් පාලන බලධාරීන්, නාගරික සංවර්ධන අධිකාරිය, දේශපාලන අධිකාරිය, ව්‍යාපෘති සම්පාදකයින්, නෛතික කටයුතු පිළිබඳ කටයුතු කරන කණ්ඩායම්, ලියාපදිංචි සිවිල් සංවිධාන සහ ව්‍යාපෘතියට වක්‍රව සම්බන්ධ වන වෙනත් පුද්ගලික හා රාජ්‍ය බලධාරීන් අයත් වේ.

ඊළඟ පියවර වශයෙන් ලියාපදිංචි සිවිල් සංවිධාන සහ ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව සහ ඵලදායී බව වර්ධනය කර ගැනීම සඳහා වැදගත් වන වෙනත් පුද්ගලයින් සහ කණ්ඩායම් පිළිබඳ විස්තරයක් සකස් කළ යුතුය. පාර්ශවකරුවන් සමග ඉතා සැලකිල්ලෙන් සැලසුම් කළ දැනුවත් කිරීමේ හා සහභාගිත්ව ක්‍රියාවලියක් සකස් කිරීම අවශ්‍ය වන අතර ඉන් පසුව තොරතුරු බෙදා හැරීමේ ක්‍රමවේදය පිළිබඳ එකඟතාවයකට එළඹිය යුතුය.

### 9.2 පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා සහභාගිත්වය

ව්‍යාපෘතියේ විනිවිදභාවය සහ බලපෑමට ලක්වූවන් හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අතර අවබෝධය පුළුල් කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ වන අවස්ථාවේදීම බලපෑමට ලක්වන පුද්ගලයින්ට ඔවුන්ගේ අයිතීන් හා වගකීම් පිළිබඳ පූර්ණ දැනුවත් භාවයක් ලබාදිය යුතුය. ඒ සඳහා ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හා අවබෝධ කර ගැනීමට අවස්ථාව පැවතිය යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී තම මව් භාෂාවට පරිවර්තනය කර දිය යුතුය. තවද, විද්‍යුත් හා මුද්‍රිත

මාධ්‍ය ඔස්සේ මෙන්ම පොදු දැන්වීම් පුවරු, අත්පත්‍රිකා සහ නිවසින් නිවස වෙත ගොස් ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කළ යුතුය.

දැනුවත් කිරීමේ උපක්‍රමයක් වශයෙන් මහජනතාව දැනුවත් කිරීමේ පොත් පිංචක් භාවිත කරනු ඇත. ඒ තුළ බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ අයිතීන් පිළිබඳ අදාළ සියලු තොරතුරු ඇතුළත් විය යුතුය. අනු ව්‍යාපෘති ප්‍රදේශයන්හි අදාළ සියලු ගෘහ ඒකක අතර එම පොත් පිංච බෙදා හැරිය යුතුය. බලපෑමට ලක් වූ පුද්ගලයින්ට හිමිවන වන්දි සහ ඔවුන්ගේ ජීවන මට්ටම යථා තත්ත්වයට පත් කිරීමට ගනු ලබන පියවරයන් පිළිබඳ පූර්ණව අවබෝධ කර ගැනීමට හැකිවන පරිදි සිංහල දෙමළ භාෂාවලින් මෙම පොත් පිංච ප්‍රකාශයට පත්කළ යුතු ය. ඒ තුළ

- ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක්
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සිදු විය හැකි බලපෑම්
- වන්දි ගෙවීමේ ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් මත බලපෑමට ලක්වූවන්ට හිමිවන අයිතීන්
- ජීවනෝපාය මාර්ග යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියේ දළ සැලැස්ම
- බලපෑමට ලක්වූවන් සහ ධාරක ප්‍රජාවද ඇතුළුව ප්‍රජා දැනුවත් කිරීම සහ සහභාගිත්වය
- ව්‍යාපෘතිය භාර ප්‍රධාන නිලධාරියාගේ නම සහ තනතුර ඇතුළත්ව සකස් කරනු ලබන වැඩසටහන් සැලැස්ම
- වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා දිස්ත්‍රික් ප්‍රධාන නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට අදාළ තොරතුරු

වගුව 08: විවිධ ව්‍යාපෘති අදියරවලදී පාර්ශවකරුවන් දැනුවත් කිරීම සහ සහයෝගීතා ක්‍රියාකාරකම්

| ව්‍යාපෘතියේ අදියරයන් | දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් |
|---|---|
| සූදානම් කිරීම හා මූලික කාර්යයන් | • ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ (ප්‍රාථමික හා ද්විතීයික) තොරතුරු ඇතුළත් දත්ත සංචිතයක් නිර්මාණය කිරීම.<br>• තොරතුරු ලබාගැනීමේ ක්‍රම සකස් කිරීම හා බෙදා හැරීම සඳහා සැලසුම් සකස් කිරීම.<br>• ඉඩම් අවශ්‍යතාව, ඉඩම් ගැටලු, විකල්ප ඉඩම්, හිමිකම් පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂවරයා, ප්‍රාදේශීය ලේකම් සහ කොලනි නිලධාරී සමඟ ප්‍රධාන කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම.<br>• නාය යෑම් අවම කිරීමේ ක්‍රියාවලියේ ප්‍රාදේශීය බලපෑම සහ නාය යෑම් අවම කළ ස්ථානයන් කළමනාකරණය පිළිබඳ පළාත් පාලන සහකාර කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් සහ පළාත් පාලන ආයතනයන්හි කොමසාරිස්/ලේකම් සමග සාකච්ඡා කිරීම<br>• ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදාල වෙනත් පාර්ශවකරුවන් සමඟ ප්‍රජා පූර්ව සූදානම, පූර්ව |

| | |
|---|---|
| | අනතුරු ඇඟවීම, හදිසි ඉවත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම. |
| ව්‍යාපෘති සැලසුම් කිරීම හා පිරිසැලසුම්කරණය | • ඉවත් කිරීමට හෝ ධාරක ප්‍රජාව බවට පත්වීමට ඉඩ ඇති පුද්ගලයින් හා කණ්ඩායම් සමග රැස්වීම් පැවැත්වීම හා වාර්තා කිරීම<br>• නැවත පදිංචි කිරීමේ හා ආදායම් මාර්ග ප්‍රතිස්ථාපනය කිරීමේ විකල්පයන් පිළිබඳ බලපෑමට ලක්වන පුද්ගලයින් දැනුවත් කිරීම.<br>• ව්‍යාපෘතියේ බලපෑම ඇගයීම සඳහා බලපෑමට ලක්වන ජනතාවගේ සහභාගිත්වය<br>• නැවත පදිංචි, ආදායම් ප්‍රතිස්ථාපනය සහ වන්දි ගෙවීම සඳහා ආයතනගත සහභාගිත්ව රාමුව<br>• නැවත පදිංචි කිරීමට යොමු විය හැකි පවුල්, ධාරකයින්, ප්‍රජා පාදක සංවිධාන වැනි පාර්ශවවලින් නැවත පදිංචි කිරීමේ ස්ථාන තෝරා ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම<br>• බලපෑමට ලක්වූවන්ගේ නියෝජනයක්ද සහිතව දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම<br>• දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම හා කොන්දේසි සහ නිර්දේශ බෙදා හැරීම |
| ක්‍රියාත්මක කිරීම | • නැවත පදිංචි කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මග හැරීමට ඉඩ ඇති පුද්ගලයින්ගේ සහභාගිත්වය<br>• නැවත පදිංචි කිරීම් ක්‍රියාවලිය සඳහා ප්‍රජා පාදක සංවිධාන සහ වෙනත් ආයතනවල මැදිහත් වීම.<br>• ජීවනෝපාය හා ආදායම් මාර්ග ප්‍රතිස්ථාපනය කිරීමේදී ප්‍රජා පාදක සංවිධානවල හා පාර්ශවකරුවන්ගේ සහයෝගය ලබා ගැනීම.<br>• තීරණ ගැනීමේ කමිටුවලට බලපෑමට ලක්වූවන් සම්බන්ද වීම<br>• දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටු ක්‍රියාකාරිත්වය සාර්ථකව බව තහවුරු වීම.<br>• නියාමන හා ඇගයීමේ කාර්යයේදී බලපෑමට ලක්වූවන්ගේ සහභාගිත්වය |

## 10. පිළියම් යෙදූ වැඩබිම් සහ කළමනාකරණය

2009 වර්ෂයේදී සකස් කරන ලද පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් තම බලප්‍රදේශය තුළ භෞතික පරිසරය ආරක්ෂා කිරීමේ හා වැඩි දියුණු කිරීමේ බලය පළාත් පාලන අධිකාරිය වෙත පවරා දී ඇත. මෙම ප්‍රතිපත්තිය හරහා සැලසුම්කරණ හා සම්බන්ධීකරණ ක්‍රියාවලියේදී ප්‍රාදේශීය පරිපාලනය හා පළාත් පාලනය පොදු අරමුණකට ගෙන ඒමට රජය විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. ඒ සඳහා මෙම පාර්ශව දෙක අතර යෝග්‍ය ආයතනික අවකාශයක් සහ සහජීවනය සඳහා වූ යාන්ත්‍රණයක් නිර්මාණය කෙරේ. මෙම ප්‍රතිපත්තිය මගින් තවදුරටත් සමස්ත දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව තුළ අදාළ පළාත් පාලන අධිකාරිය තම බලප්‍රදේශයේ ආපදා පෙර සූදානම ආපදා අවම කිරීම සහ කළමනාකරණය කෙරෙහි ක්‍රියාකාරීව මැදිහත්වීමක් සිදු කරන බව තහවුරු කෙරේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් නීතිමය බලයක් නොමැත. පොදු ඉඩම් පිළිබඳ අයිතිය හිමිවන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාටය. මෙම තත්ත්වය තුළ නාය යෑම අවම කරන ලද වැඩම් ආරක්ෂා කිරීම/ නඩත්තු කිරීම හා ජා. ගො. ප. ස. උපදෙස් මත අදාළ ස්ථාන භාවිත කිරීම සඳහා ත්‍රිත්ව පාර්ශවීය ගිවිසුමකට එළඹිය යුතුය. එම ගිවිසුමෙහි පාර්ශවකරුවන් වන්නේ අදාළ පළාත් පාලන අධිකාරිය, අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයයි. ඒ අනුව නාය යෑම් අවම කරන ලද ස්ථානයන් භාවිත කිරීමට අදාළ පළාත් පාලන අධිකාරියට අනුමැතිය ලබා දිය හැකි අතර එහිදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද සංවර්ධන සැලසුම් කෙටුම්පත්/ ගැසට් පත්‍රවලට සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මාර්ගෝපදේශ මත ක්‍රියාත්මක කරන සංවර්ධන කටයුතුවලට අනකූල විය හැකිය.

## 11. ගැටලු විශ්ලේෂණය සහ දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය

දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය යන්න දුක් ගැනවිලි සඳහා අපේක්ෂා කරන සහ සපයන සහනය අනුව ආයතනයක්, උපකරණ, ක්‍රමවේදයන් හා ක්‍රියාවලියක් වේ. සුපරීක්ෂාකාරීව සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් දුක් ගැනවිලි වැළැක්වීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. එහෙත් සංකීර්ණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දුක්ගැනවිලි ඇති වීම පාලනය කළ හැකි නොවේ. එබැවින් බලපෑමට ලක්වන පුද්ගලයින් හෝ කණ්ඩායම්වලට තම දුක්ගැනවිලි සඳහා සාධාරණ හෝ අලාභයට සමාන මට්ටමේ සහනයක් ලැබීම හෝ තම අපේක්ෂාවන් තෘප්තිමත් වන ආකාරයේ විසඳුමක් ලබා දීම සඳහා ආයතනගත දුක් ගැනවිලිවලට සහන සැලසීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ. එම යාන්ත්‍රණය හරහා යෝග්‍ය සහන සැලසීම තුළින් බලපෑමට ලක්වන පුද්ගලයින් තුළ ව්‍යාපෘතිය පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කරනු ලබයි. ව්‍යාපෘතිය සැලසුම් කර ඇති කාල රාමුවට අනුකූලව ක්‍රියාත්මක කිරීමට එම විශ්වාසනීයත්වය ඉතා වැදගත් වේ. එසේම බලපෑමට ලක්වන පුද්ගලයින්ට පහසුවෙන් එම යාන්ත්‍රණය වෙත ප්‍රවේශ වීමට හැකියාව පැවතීම මෙන්ම යාන්ත්‍රණයේ විනිවිදභාවය, පිරිවැය ඵලදායී බව, කාර්යක්ෂමතාව සහ දුක්ගැනවිලි සඳහා ඉක්මන් ප්‍රතිචාර දැක්වීම යන ගුණාංග ඉතා වැදගත් වේ.

දුක් ගැනවිලි ලබා ගැනීමට සහ ඒවාට සහන සැලසීමට ක්‍රියාත්මක වන යාන්ත්‍රණයේ අදියර තුනකි.

1. දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ ප්‍රාදේශීය කමිටුව

2. දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ දිස්ත්‍රික් කමිටුව

3. ස්වාධීන දුක් ගැනවිලි මණ්ඩලය

**දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ ප්‍රාදේශීය කමිටුව:** මෙහිදී බලපෑමට ලක්වූවන් තම දුක්ගැනවිල්ල ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සංවර්ධන නිලධාරීවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම ඒකකයේ ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ විශේෂඥ නිලධාරීවරයාගේ මග පෙන්වීම යටතේ සමාජ සංවර්ධන නිලධාරීවරයා විසින් එම දුක් ගැනවිල්ල, දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ ප්‍රාදේශීය කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් අනතුරුව එම දුක් ගැනවිලි පූර්ණ වශයෙන් පරිගණකගත කළ දත්ත සංචිතයක් තුළට ඇතුළත් කරනු ලබයි. එම පරිගණකගත දත්ත සංචිතය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථමව සකස් කරනු ලබන අතර ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පවත්වාගෙන යනු ලබයි. කිසියම් ව්‍යාපෘති ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදුවන හානි තක්සේරුකරණය පිළිබඳව, හිමිකම් පිළිබඳව හෝ බලපෑමට ලක්වූ පුද්ගලයින් අතර ඇතිවන ගැටලු විසඳීමේදී අදාළ ග්‍රාම නිලධාරීවරයාගේ සහයෝගය ලබා ගත යුතුය. දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වන්නේ බලපෑමට ලක්වන පුද්ගලයින් හා ව්‍යාපෘති සහයෝගීතා ආයතන යන දෙපාර්ශවයම එකඟ වන පරිදිය. එම ක්‍රියාවලියේදී ප්‍රදේශය පිළිබඳව මනා දැනුවත් භාවයක් සහිත ග්‍රාම නිලධාරීවරයාගේ සහයෝගය මත දුක් ගැනවිලි සඳහා සහන සැලසීමට උපරිම උත්සාහයක් දරනු ලැබේ. ව්‍යාපෘති ඒකකයට දුක්ගැනවිලි භාරදීමෙන් පසු සතියක කාලයක් තුළ ඒ පිළිබඳ තීරණය ලබා දිය යුතුය.

**දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ප්‍රාදේශීය කමිටුවේ සාමාජිකයින්;**

- අදාළ වසමේ ග්‍රාම නිලධාරිවරයා
- බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ නියෝජිතයකු
- පළාත් පාලන නියෝජිතයෙකු
- ප්‍රාදේශීය සමාජ සංවර්ධන නිලධාරීවරයා
- ප්‍රාදේශීය ආපදා සහන සේවා නිලධාරී
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සංවර්ධන නිලධාරීවරයා

**දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ දිස්ත්‍රික් කමිටුව**; යම් හෙයකින් දුක් ගැනවිලි සඳහා දෙපාර්ශවය එකඟ වන විසඳුමකට එළඹීමට නොහැකි අවස්ථාවකදී, ඊට අදාළ සියලු ලිපි ලේඛන සහිතව එම දුක් ගැනවිල්ල දිස්ත්‍රික් කමිටුව වෙත යොමු කළ යුතුය. එම කාර්යය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සංවර්ධන නිලධාරියා විසින් සිදු කරනු ලැබේ. දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කරනු ලබන දුක් ගැනවිලි සඳහා සති දෙකක කාලයක් තුළ තීරණයක් ලබාදිය යුතු අතර ඒ සඳහා ව්‍යාපෘති සහයෝගීතා අයතනයන්හි නිර්දේශ ඡලකා බැලියයුතුය. දුක් ගැනවිලි සඳහා සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සමග බද්ධ වූ මනා ආයතනික ව්‍යුහයකින් දිස්ත්‍රික් කමිටුව සමන්විත වේ. මෙම දිස්ත්‍රික් කමිටු යන්ත්‍රණය අදාළව; සාමාජිකයින්ගේ විස්තර, දුක්ගැනවිලි විභාග කිරීමේ යාන්ත්‍රණය, පැමිණිලි භාර

ගැනීම සහ තීරණ ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව පුළුල් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය සංවර්ධන නිලධාරීවරයා, ලියාපදිංචි සිවිල් සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධාන යනාදියේ සහයෝගය ලබා ගත යුතුය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත දුක්ගැනවිලි ලෙස වන්දි ගෙවීමේ අනුපාතය, තෝරා ගැනීමේ නිර්ණායක, නැවත පදිංචි කිරීමේ ස්ථාන, එම ස්ථානයන්හි පවතින පොදු උපයෝගීතා සේවා පහසුකම්වල ගුණාත්මක භාවය යනාදිය පිළිබඳව හෝ අහිතකර සමාජයීය බලපෑම අවම කිරීමට හා තක්සෙරු කිරීමට මෙම ප්‍රතිපත්ති රාමුව තුළ භාවිත කරනු ලබන මාර්ගෝපදේශයන් පිළිබඳව හෝ අතෘප්තිකර තත්ත්වයන් ඇතිවිය හැකිය.

දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ දිස්ත්‍රික් කමිටුවේ ක්‍රියාකාරිත්වයට අදාළ විධිවිධාන

අ) දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශිත අයදුම් පත්‍රය (ඇමුණුම 3 - ආදර්ශ අයදුම් පත්‍රය)

ආ) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සංවර්ධන නිලධාරියා විසින් දුක් ගැනවිලිවලට ඇහුම්කන් දීම, ඒවා ලියාපදිංචි කිරීම සහ වර්ග කිරීම පිළිබඳ ක්‍රමවේදය ලේඛනගත කිරීම

ඇ) පැමිණිලි පාර්ශවය එකඟ වූ තීරණ සහ යම් සිදු වීමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමට හේතු ලේඛනගත කිරීම

ඉ) තීරණ ක්‍රියාත්මක කිරීම; සහ

ඊ) නිවැරදිව ක්‍රියාත්මක කරවීම, නියාමනය සහ ප්‍රලේඛනය


**දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ දිස්ත්‍රික් කමිටුවේ සාමාජිකයින්;**

- අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) - සභාපති
- ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්
- මැනුම්පති හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකු
- ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකු
- මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජිතයකු
- ශ්‍රී ලංකා දුම්රිය සේවයේ නියෝජිතයකු
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ විශේෂඥ
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සංවර්ධන නිලධාරී

**ස්වාධීන දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ මණ්ඩලය;** දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ දිස්ත්‍රික් කමිටුව විසින් ලබාදුන් තීරණයටද බලපෑමට ලක්වූ පාර්ශවය එකඟ නොවන්නේ නම් ඔවුන්ට තම දුක් ගැනවිලි ස්වාධීන මණ්ඩලයට ඉදිරිපත් කළ හැකිය. මෙම මණ්ඩලය, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ සහකාර ලේකම් (සංවර්ධන), තක්සේරුකරන දෙපාර්තමේන්තුවේ නීතිඥවරයකු සහ පළමු ශ්‍රේණියේ විශ්‍රාමික පරිපාලන නිලධාරියෙකුගෙන්

සමන්විත වේ. මෙම මණ්ඩලයේ සභාපතිවරයා ලෙස වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ සහකාර ලේකම් (සංවර්ධන) කටයුතු කරනු ලබයි. මණ්ඩලය විසින් දුක්ගැනවිලි පිළිබඳ පරීක්ෂා කර සති දෙකක කාලයක් තුළ සිය තීරණය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වෙත ලබා දිය යුතුය. අධ්‍යක්ෂවරයා විසින් එම තීරණය බලපෑමට ලක්වූ පාර්ශවයට ලිඛිතව දැනුම් දෙනු ලැබේ. යම් හෙයකින් ස්වාධීන මණ්ඩලය විසින් ගනු ලබන තීරණයටද බලපෑමට ලක්වූ පාර්ශවය එකඟ නොවන්නේ නම් ඔවුන්ට ඒ පිළිබඳව අධිකරණයට යොමු වීමට අවස්ථාව පවතී.

**දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය**



## 12. නියාමනය සහ අධීක්ෂණය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් නියාමනය හා වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලබයි. මෙම යාන්ත්‍රණය සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන්ට අනුකූලව ක්‍රියාත්මක වන අතර එමගින් ව්‍යාපෘතිය තුළ සමාජයීය ආරක්ෂණ ක්‍රමවේදයන් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගන්නේද යන්න තහවුරු කෙරේ. ඊට අමතරව ස්වාධීන සමාජයීය ආරක්ෂණ නියාමනයන්ද ඇතුළුව නියාමන හා වාර්තා කිරීම් සඳහා යාන්ත්‍රණයක්ද ස්ථාපිත කරනු ලබයි.

ව්‍යාපෘතිය තුළ ක්‍රියාත්මක කරනු ලබන සමාජයීය ආරක්ෂණ වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳව විධිමත්ව තොරතුරු රැස්කිරීමේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හරහා පාර්ශවකරුවන් වෙත නිගමන ඉදිරිපත් කිරීමේ වගකීම එම යාන්ත්‍රණයට පැවරේ. මෙම ක්‍රියාවලියේ සමස්ත අරමුණ වන්නේ නාය යෑම් අවමකරණ ක්‍රියාමාර්ගයන්හි ප්‍රකාශිත ප්‍රතිඵල අත්පත් කර ගැනීම තහවුරු කිරීමයි. නියාමන යාන්ත්‍රණය තුළ; මාර්ගෝපදේශ, නියමයන් හා කොන්දේසි, නියාමන දර්ශක, ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ක්‍රමවේද, ක්‍රියාත්මක කළ යුතු වාර ගණන, ලිපි ලේඛන සැකසීම හා වාර්තාකරණ ක්‍රියාකාරකම් අන්තර්ගත වේ.

### නියාමන කාර්යයන් හා වගකීම්

සමාජ ආරක්ෂණ වැඩසටහන තුළ නියාමන කාර්යයන් හා වගකීම් කිහිපයක් හඳුනා ගත හැකිය. මෙම නියාමන කාර්යයන් හා වගකීම් සමස්ත ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියට අනුගත විය යුතු අතර ව්‍යාපෘතියේ පාර්ශවකරුවන් සහ බලපෑමට ලක්වූ පවුල් හා ජනතාව සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමට හැකිවන පරිදි සංවිධානය කළ යුතුය.

### අ) පාර්ශවකරුවන්ගේ සමුළුව

සමාජයීය කළමනාකරණ ක්‍රියාවලිය සඳහා සහයෝගගීතාවක් ගොඩනැගීමට අමතරව බලපෑමට ලක්වූ නැවත පදිංචි කළ ජනතාවගේ නියෝජනයක්ද සහිතව පාර්ශවකරවන්ගේ සමුළුවක් ස්ථාපිත කරනු ලබයි. එම සමුළුව වර්ෂ දෙකකට වරක් රැස්වන අතර එම සමුළුවට සමාජයීය කළමනාකරණ ඒකකය විසින් පවතින සමාජ ආරක්ෂණ වැඩසටහන්හි ප්‍රගතිය සහ ඊළඟ සමුළුව දක්වා වැඩසටහන් ක්‍රියාකාරිත්වය දැක්වෙන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. මෙම සමුළුවේදී එම වාර්තාව සමාලෝචනය කිරීම, ක්‍රියාත්මක කිරීමේ ගැටලු හඳුනා ගැනීම, යෝජිත අවදානම් අවමකරණ පියවරයන් හා පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා සලකා බැලීම යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ.

### ආ) ව්‍යපෘති කළමනාකරණ ඒකකය

ව්‍යපෘති කළමනාකරණ ඒකකය මෙම ව්‍යාපෘතියේ සමස්ත සමාලෝචන කාර්යය සිදු කරනු ලබන අතර ඊට මාසික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටු රැස්වීමට නියාමන හා ඇගයීම් ඒකක විසින් ඉදිරිපත් කරනු ලබන නියාමන වාර්තා ලැබිය යුතුය. නාය යෑම් අවමකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශයන්හි පදිංචිව සිටින ජනතාව පිළිබඳ නියාමන කාර්යය සඳහා මෙම ඒකකය තුළ දත්ත සංචිතයක් ස්ථාපිත කරනු ලබයි. එම දත්ත පද්ධතිය තුළට ඇතුළත් කරනු ලබන එක් එක් ගොඩනැගිලි සඳහා ලියාපදිංචි අංකයක් ලබා දෙන අතර ඒ යටතේ ඔවුන් පිළිබඳ තොරතුරු රැස් කරනු ලබයි. ඒ තුළ i) පොදු තොරතුරු, ii) කුටුම්භයේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, iii) ඉඩම් පරිහරණය සහ නිවාස

ඒකකයන්හි තොරතුරු, iv) ආපදා බලපෑම, v) ගෙන ඇති ආපදා අවමකරණ පියවරයන් ඇතුළත් වේ. මෙම දත්ත පද්ධතිය තුළින් එක් එක් අනු ව්‍යාපෘතිවලට අදාළව විස්තරාත්මක සංඛ්‍යානමය තොරතුරු (ප්‍රතිශත, සංඛ්‍යාත වැනි) ලබා ගත හැකිවේ. මෙම දත්ත පද්ධතිය කළමනාකරණයේ සහ විශ්ලේෂණය කිරීමේ වගකීම සමාජ ආරක්ෂණය පිළිබඳ විශේෂඥයකු වෙත පැවරෙන අතර ව්‍යාපෘතියේ එක් එක් අදියරට අදාළව නිවාස ඒකකයන්ට සිදුවන බලපෑම සහ වෙනස්කම් අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන කළ යුතුය.

නියාමන හා ඇගයීමේ ඒකක

පාරිසරික හා සමාජයීය කළමනාකරණ ඒකකයන්ම නියාමන හා ඇගයීමේ ඒකක වශයෙන් ක්‍රියාත්මක වේ. එම ඒකකයන්හි වගකීම වනුයේ

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අවශ්‍ය සන්නිවේදන හා තාක්ෂණික සහයෝගය ලබා දීම
- සමජයීය කළමනාකරණ වැඩසටහනට අදාළව දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ වාර්තා කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
- නියාමන පිරිසැලසුම් අනුව වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම, සහ;
- විශේෂයෙන් පාර්ශවකරුවන්ගේ සමුළුව සඳහා භාහිර නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

මෙම ක්‍රියාකාරකම් මත පදනම්ව නියාමන යාන්ත්‍රණය ක්‍රියාත්මක වේ. එම යාන්ත්‍රණය පහත දැක්වෙන ක්‍රියාවලිය, ප්‍රතිඵල, ප්‍රතිඵල දැක්වෙන දර්ශකයන් ඇතුළත් රාමුව යටතේ ක්‍රියාත්මක වේ.

**වගුව 09. සමාජයීය ආරක්ෂණ ක්‍රියාකාරකම් නියාමනය හා ඇගයීම සඳහා වන දර්ශක හා විචල්‍යයන්**

| දර්ශකයන් | **විචල්‍යයන්** |
|---|---|
| අ) සහභාගිත්වය හා උපදේශනය | ▪ පාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ උපදේශනය සඳහා සහභාගිත්වය<br>▪ පාර්ශවකරුවන්ගේ සංවිධාන විසින් ක්ෂේත්‍ර නිරීක්ෂණයන් සිදු කිරීම<br>▪ අරමුණ, ස්ථානය, සහභාගිත්වය යනාදිය මත සහභාගීවන්නෝ සහභාගිත්වය හා උපදේශන සංඛ්‍යාව |
| ආ) ශක්‍යතා වර්ධනය හා පුහුණු කිරීම | ▪ කාර්යය මණ්ඩලයට හා වෙනත් නිලධාරීන්ට ලබාදෙන පුහුණු වැඩමටහන් සහ ඒවාට සහභාගී වන සංඛ්‍යාව<br>▪ හඳුන්වා දෙනු ලබන පද්ධති හා ක්‍රියාවලීන් සංඛ්‍යාව |
| ඇ) දුක් ගැනවිලි සඳහා සහන | ▪ වර්ගය අනුව ලැබුණු දුක්ගැනවිලි සංඛ්‍යාව හා සහන සැලසීමේ කමුටව විසින් විසඳුම් ලබාදුන් සංඛ්‍යාව; සහන සපයන ලද, ප්‍රතිචාර දැක්වීමේ කාල සීමාව |
| ඈ) හිමිකම් සහ වන්දි ගෙවීම | ▪ අලාභයේ ස්වභාවය අනුව වන්දි හිමිවූ පුද්ගලයින් ගණන<br>▪ නැවත පදිංචි කිරීම් සඳහා සහය ලද පුද්ගලයින් ගණන |

| | |
|---|---|
| ඉ) සංස්කෘතික හා ප්‍රජා වත්කම් ප්‍රතිස්ථාපනය | ▪ නැවත ස්ථානගත/ ප්‍රතිස්ථාපනය කළ යුතු ප්‍රජා වත්කම් සංඛ්‍යාව<br>▪ නැවත ස්ථානගත/ ප්‍රතිස්ථාපනය කළ ප්‍රජා වත්කම් සංඛ්‍යාව |
| ඊ) ගොදුරු විය හැකි කුටුම්භ, කණ්ඩායම් සහ පුද්ගලයින් | ▪ සහය අවශ්‍ය ගොදුරු විය හැකි පුද්ගලයින් සංඛ්‍යාව (දුප්පතුන්, කාන්තාවන්, ළමුන් සහ ආබාධිතයින්)<br>▪ සහය ලැබූ ගොදුරුවිය හැකි කණ්ඩායම් ගණන<br>▪ සපයන ලද පහසුකම් ඵලදායීව භාවිත කරනු ලබන පුද්ගලයින් ගණන |
| උ) නාය යෑම් අවම කිරීමේ ප්‍රතිලාභ | ▪ සුරක්ෂිත වන නිවාස ගණන<br>▪ සුරක්ෂිත වන පුද්ගලයින් ගණන<br>▪ සුරක්ෂිත වන ව්‍යාපාරික ගොඩනැගිලි ගණන<br>▪ සුරක්ෂිත වන පවුල් ගණන<br>▪ සුරක්ෂිත වන මාර්ග ජාලයේ වටිනාකම |

**13. ශක්‍යතා වර්ධනය සහ පුහුණු කිරීම්**

දැනුම, ධාරිතාව හා භාවිතය අඩු බැවින් සමාජයීය කළමනාකරණ හා නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ ප්‍රතිපත්ති රාමුවේ සඳහන් නිර්ණායකයන්ට අනුව සමාජයීය ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සතු ශක්‍යතාව ප්‍රමාණවත් නොවේ. සමාජයීය ආරක්ෂණ විශේෂඥයකු හෝ කිහිප දෙනෙකු බඳවා ගැනීම මගින් සමාජයීය හා පාරිසරික ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සිදු කළ යුතුය. තවද, විශේෂයෙන් දැනුම පදනම් කරගත් ඵලදායී දුක්ගැනවිලි සහන සැලසීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමද අවශ්‍ය වේ. එබැවින්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ශක්‍යතා වර්ධන ක්‍රියාවලියේ කොටසක් වශයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ සිට සමාජ සංවර්ධන නිලධාරීන් දක්වා සමාජ කළමනාකරණ ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් කිරීමේ සහ ශක්‍යතා වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවක් පවතී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය තුළ කොන්ත්‍රාත්කරුවන් හා නියාමන නිලධාරීන් විසින් සමාජ ආරක්ෂණ අවශ්‍යතාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ද මෙම ශක්‍යතා වර්ධන වැඩසටහනේ කොටසක් වශයෙන් සිදු කළ යුතුය.

# ඇමුණුම්

ඇමුණුම් සඳහා ඉංග්‍රීසි පිටපත පරිශීලනය කළ යුතුය. ඇමුණුම්වල සංක්ෂිප්තයක් පමණක් මෙහි දැක්වේ.

ඇමුණුම 01. නාය යෑම් හේතුවෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව

ඇමුණුම් 02. ඉඩම් හිමියන් සමඟ ඇතිකර ගැනීමට නියමිත ගිවිසුම

ඇමුණුම් 03. දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා වන අයදුම් පත්‍රය

ඇමුණුම් 04. ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් හා අත්දැකීම්